# 1

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව, ඉදිරි දැක්ම හා ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ


ශ්‍රී ලංකා ආර්ථිකය 2010 වසරේ දී සියයට 8.0 ක ආකර්ෂණීය වර්ධනයක් අත් කර ගත් අතර, එමගින් 2009 දී ඇති වූ ආර්ථික පසුබෑමේ සිට ආර්ථිකය වේගවත්ව යථාතත්ත්වයට පත්වීම මෙන්ම ඉහළ හා තිරසාර වර්ධන මාවතකට ප්‍රවිෂ්ටවීම පිළිබිඹු විය. ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ ප්‍රශංසනීය වර්ධනයක් වාර්තා කළ අතර, රට තුළ සාමකාමී වාතාවරණයක් පැවතීම, ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණුවීම, යහපත් සාර්ව ආර්ථික වාතාවරණය සහ ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික අවපාතයකින් ලෝක ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම මෙම ඉහළ ආර්ථික වර්ධනය සඳහා හේතු විය. උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් අඩු මට්ටමක පැවතීම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීම, සියලු වෙළෙඳපොළවල පොලී අනුපාතික තවදුරටත් පහත වැටීමට හේතු වූ අතර, එය දේශීය ආර්ථික කටයුතු යථාතත්ත්වයට පත්වීමට උපකාරී විය. රජයේ ආදායම වර්ධනය වීම සහ වර්තන වියදම් පාලනය කිරීම පිළිබිඹු කරමින් රාජ්‍ය මූල්‍ය තත්ත්වයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. 2009 දෙවන කාර්තුවේ සිට සුවිශේෂී ප්‍රගතියක් පෙන්නුම් කළ විදේශීය අංශය 2010 වසර තුළ දී තවදුරටත් වර්ධනය විය. 2010 වසරේ දී ආනයන සහ අපනයන යන දෙඅංශයම ශක්තිමත් ලෙස යථාතත්ත්වයට පත්වූ අතර, ප්‍රසාරණය වූ වෙළෙඳ ගිණුමේ හිඟය, සංචාරක කර්මාන්තයෙන් වූ විදේශ විනිමය ඉපැයීම් සහ විදේශීය ප්‍රේෂණ ලැබීම් ඉහළ යාම තුළින් සැලකිය යුතු ප්‍රමාණයකින් සමනය වූ බැවින්, වර්තන ගිණුමේ හිඟය සීමාවීමට එය උපකාරී විය. විදේශීය ප්‍රාග්ධන සහ මූල්‍ය ප්‍රවාහයන් ඉහළයාමත් සමග 2010 වසරේ ගෙවුම් ශේෂ අතිරික්තයක් වාර්තා කළ අතර, එය රටෙහි විදේශීය සංචිත ශක්තිමත් කිරීමට උපකාරී විය. යහපත් සාර්ව ආර්ථික වාතාවරණය සහ මූල්‍ය පද්ධතියේ නියාමන හා අධීක්ෂණ රාමුවෙහි දායකත්වය හේතුකොට ගෙන මූල්‍ය අංශයෙහි ක්‍රියාකාරිත්වය වර්ධනය වූ අතර, පද්ධති ස්ථායිතාව ශක්තිමත් විය.

**උද්ධමනය මැදි තනි අංකයක් වාර්තා කරමින් තවදුරටත් අඩු මට්ටමක පැවතීම හා උද්ධමන අපේක්ෂාවන් හිතකර තත්ත්වයක පැවතීම නිසා මහ බැංකුවට සිය මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට හැකි විය.** උද්ධමනය සඳහා ඉල්ලුම් අංශයෙන් දැඩි පීඩනයක් ඇති නොවූ අතර, දේශීය සැපයුම් අංශයේ ඇති වූ හිතකර වර්ධනය, ඇතැම්

1

**ආර්ථිකය, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව, ඉදිරි දැක්ම හා ප්‍රතිපත්ති**

**1.1 රූප සටහන** **කාර්තුමය ආර්ථික වර්ධනය සහ සේවා වියුක්තිය**





පාලිත මිල ගණන් පහළ දැමීම සහ ඇතැම් පාරිභෝගික භාණ්ඩ මත පනවා තිබූ ආනයන බදු අඩු කිරීම මිල මට්ටම් කෙරෙහි යහපත් බලපෑමක් ඇති කළේය. ආර්ථික කටයුතු වර්ධනයට තවදුරටත් සහායවීමේ අරමුණින් මහ බැංකුව 2010 ජූලි මාසයේ දී ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකයන් පදනම් අංක 25 කින් ද අගෝස්තු මාසයේ දී ප්‍රතිවිකුණුම් අනුපාතිකය තවදුරටත් පදනම් අංක 50 කින් ද පහළ දැමීය. ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීමට සමගාමීව වෙළෙඳපොළ පොලී අනුපාතික ද තවදුරටත් පහළ දමන ලද අතර, මුදල් සමස්තයන්ගේ වර්ධනය අපේක්ෂිත මට්ටමේ පැවතුණි. 2010 අවසානයේ දී පුළුල් මුදල් සැපයුම සියයට 15.8 ක වර්ධනයක් පෙන්නුම් කළ ද, 2010 සැප්තැම්බර් මාසය අග වන විට සියයට 13.6 ක් දක්වා ක්‍රමිකව අඩුවන තත්ත්වයක් පැවතුණි. පුළුල් මුදල් සැපයුමේ මෙම වර්ධනයට මූලික වශයෙන්ම හේතු වූයේ වාණිජ බැංකුවලින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණය වැඩිවීමයි. 2009 දී සියයට 5.8 කින් අඩු වූ පෞද්ගලික අංශයට දෙන ලද ණය, දේශීය ආර්ථික කටයුතු යථාතත්ත්වයට පත්වීම සහ පශ්චාත් ගැටුම්කාරී තත්ත්වය තුළ ආර්ථිකයේ පැවති ධාරිතාවයේ වැඩිදියුණුවීම සමග පෞද්ගලික අංශයේ ණය සඳහා වූ ඉල්ලුම විශාල වශයෙන් ඉහළ යාම පෙන්නුම් කරමින් 2010 වසරේ දී සියයට 25.1 ක වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, ඉදිරි කාලයේ දී දේශීය ණය ප්‍රමාණය වැඩි වේගයකින් වර්ධනය වීමට සහ විදේශ ප්‍රාග්ධන ලැබීම් ඉහළයාමට ඇති ප්‍රවණතාවය හේතුවෙන් මුදල් කළමනාකරණය අභියෝගාත්මක විය හැකිය. එබැවින් සාර්ව ආර්ථික විචල්‍යයන් දැඩිව අධීක්ෂණය කිරීම සහ ඉල්ලුම් පීඩනයන් ඉහළ යාම වැළැක්වීම සඳහා සුදුසු ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වනු ඇත.

2010 වසර තුළ සමස්ත රාජ්‍ය මූල්‍ය කටයුතුවල දිරිගන්වන සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, මේ සඳහා ආර්ථික කටයුතු පුළුල්වීම සහ බදු ක්‍රමයේ කාලයක් තිස්සේ පැවති ව්‍යුහාත්මක ගැටලු විසඳීමට ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් රජයේ ආදායම සැලකිය යුතු ලෙස යථාතත්ත්වයට පත්වීමත් වර්තන වියදම් පාලනය කිරීමත්, හේතු විය. දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2009 වසරේ සියයට 9.9 සිට 2010 දී සියයට 7.9 ට අඩු විය. අයවැය හිඟය 2011 දී සියයට 6.8 කට ගෙනඒමත් මැදිකාලීනව සියයට 5 කට වඩා අඩුවෙන් පවත්වා ගැනීමත් තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වාගෙන යාමට රජයේ ඇති කැපවීම සහතික කොට ඇත. බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිසන් සභාවේ නිර්දේශ අනුව යමින් බදු ක්‍රමය සරල කිරීම, බදු නිදහස් කිරීම වඩාත් තාර්කීකරණය කිරීම, බදු අනුකූලතාව වැඩි දියුණු කිරීම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම යන අංශවල වැදගත් සංශෝධන කිහිපයක් හඳුන්වා දෙන ලදී. එයට අමතරව, විශාල සහ උපායමාර්ගික ආයෝජන සඳහා වැඩි අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ඇති බදු සහන වඩාත් තාර්කීකරණය කිරීම සඳහා පියවර ගෙන ඇත. අඛණ්ඩව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වාගෙනයාම සඳහා දරනු ලබන උත්සාහයන් ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට වඩාත් උපකාරී වේ.

යහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හා ආර්ථික කටයුතු යථාතත්ත්වයට පත්වීමත් සමග 2010 වසර තුළ දී මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ ස්ථායීතාවය ශක්තිමත් විය. මෙම ඉහළ කාර්යසාධනය සියලුම මූල්‍ය විචක්ෂණ දර්ශකවලින් පෙන්නුම් කරයි. බැංකු

**1.2 රූප සටහන** **උද්ධමනය**



අංශයේ ණය ලබාදීම් ශීඝ්‍රයෙන් යථාතත්ත්වයට පත්වීම, ලාභදායිත්වය ඉහළයාම, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය නියමිත මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවතීම, අක්‍රීය ණය අනුපාතය පහළ වැටීම, ආපසු නොගෙවන ණය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් වැඩිවීම මූල්‍ය අංශයේ දැකිය හැකි වූ විශේෂ ලක්ෂණ විය. දුෂ්කර මූල්‍ය තත්ත්වයන් පෙන්නුම් කළ මූල්‍ය සමාගම්වල ක්‍රියාකාරීත්වය ඉක්මණින් යථාතත්ත්වයට පත් වූ අතර, මූල්‍ය වෙළෙඳපොළ අඛණ්ඩවම ද්‍රවශීලව පැවතුණි. විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල මූල්‍ය සේවා වර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සමග බැංකු සහ අනෙකුත් මූල්‍ය අංශවල ශාඛා ජාලය තවදුරටත් පුළුල් විය. ගෙවීම් පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. කුඩා පරිමාණ තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම සඳහා 2010 වසරේ දී බලපත්‍රලාභී බැංකු සහ මූල්‍ය සමාගම්වලට අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. කෙසේ වුවද, තැන්පතු හා ණය පොලී අනුපාතික අතර පවතින කැපීපෙනෙන වෙනස මගින් පිළිබිඹුවන පරිදි මූල්‍ය අතරමැදි පිරිවැය ඉහළ මට්ටමක පැවතීම සහ සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි දැකිය හැකි අඩු වර්ධනය යනාදිය තවදුරටත් අවධානය යොමු විය යුතු අංශ වේ.

**සාර්ව ආර්ථික ප්‍රතිපත්තියෙහි අවසන් අරමුණ වන ජනතාවගේ සමාජ සුභසිද්ධිය ඉහළ නැංවීම සම්බන්ධයෙන් බලනකල සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ යටතේ පවත්නා ඉලක්ක ඉක්මවා යමින් දරිද්‍රතාව අඩුවීම සහ සේවා වියුක්තිය අඛණ්ඩව පහළ වැටීම සුවිශේෂී ජයග්‍රහණයකි.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව 2006/2007 දී සියයට 15.2 ක්ව පැවති දිළිඳු කුටුම්භ ප්‍රතිශතය, 2009/2010 වසර සඳහා වන එම සමීක්ෂණයේ තාවකාලික දත්තවලින් පෙන්වා දෙන ආකාරයට සියයට 7.6 දක්වා පහළ වැටී ඇති අතර, එම අඩුවීම ග්‍රාමීය හා වතු අංශය සම්බන්ධයෙන් කැපී පෙනුණි. 2002 වන විට උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ හැර අනෙකුත් ප්‍රදේශවල සියයට 8.8 ක්ව පැවති සේවා වියුක්ති අනුපාතය, 2010 වන විට සියයට 4.9 ක් දක්වා පහළ වැටී ඇත. කෙසේ වුවද, විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා රැකියා අවස්ථා වැඩිදියුණු කිරීමට තවදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුව ඇත.

**දශක තුනක කාලයක් පුරා පැවති ගැටුම්කාරී තත්ත්වය නිමවීමෙන් පසුව ආර්ථික කටයුතු ක්‍රියාවට නැංවූ පූර්ණ පළමු වසර වන 2010 දී, ශ්‍රී ලංකා ආර්ථිකය එහි සැබෑ විභවතාව පෙන්නුම් කර ඇති අතර, සිත්ගන්නා සුළු සාර්ව ආර්ථික ජයග්‍රහණ අත්කර ගෙන ඇත.** අද වන විට ප්‍රතිපත්ති සම්පාදකයින් හමුවේ ඇති අභියෝගය වනුයේ නිරන්තරයෙන් ඇතිවන අභ්‍යන්තර සහ බාහිර කම්පනයන් හමුවේ මෙම සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වා ගෙන යාමයි. අඩු සහ ස්ථායී උද්ධමනයක් පවත්වාගෙන යාම සඳහා සුදුසු ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති අවශ්‍ය වන අතර, සැපයුම් අංශයේ පවතින අවහිරතා සඳහා සාර්ථක විසඳුම් සෙවීම ද අවශ්‍ය වේ. ඵලදායීතාව අඛණ්ඩව වර්ධනය කිරීම, මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ නව තාක්ෂණයට අනුගතවීම, ශ්‍රම වෙළෙඳපොළ මත ඇති පීඩනය අඩු කිරීමට හේතු වන අතර, භෞතික යටිතල පහසුකම් දියුණු කිරීම සහ පවත්නා කම්කරු නීතිවලට සුදුසු වෙනස්කම් හඳුන්වාදීම තුළින් අපේක්ෂිත ඉහළ වර්ධනය පවත්වාගෙන යාමට ශ්‍රම සංචලනය මෙන්ම ශ්‍රම සැපයුම ද වැඩිදියුණු කළ හැක. බාහිර කම්පනවලට ඔරොත්තු දීමට දේශීය ආර්ථිකයට ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා අපනයන භාණ්ඩ සහ අපනයන වෙළෙඳපොළ යන දෙකම විවිධාංගීකරණය කළයුතුව ඇත. මේ සඳහා දැනට පවතින ද්විපාර්ශවික හා බහුපාර්ශවික වෙළෙඳ ගිවිසුම් ඵලදායී ලෙස භාවිතා කිරීමත්, නැගී එන කලාපීය වෙළෙඳපොළවල් සමග වෙළෙඳ සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා ක්‍රියාශීලීව කටයුතු කිරීම මෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීමත්, ව්‍යාපාර කරගෙන යාම සඳහා සුදුසු පරිසරයක් සැකසීමත්, අවශ්‍ය වේ. බොරතෙල් මිල ගණන් ඉහළ යාම වැනි විදේශීය අංශයේ අහිතකර වර්ධනයන් නිසා දේශීය ආර්ථිකයට ඇති විය හැකි බලපෑම, ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්වල ආයතනික රාමුව වෙනස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම හා ඒවා වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ වෙළෙඳපොළ තත්ත්වයන් පිළිබිඹු වන ලෙසින් එම ආයතන වාණිජමය මට්ටමකින් තිරසාර අයුරකින් පවත්වාගෙනයාම තුළින් අඩු කළ හැකි වේ. මෙම ක්‍රියාමාර්ග දැනට කරගෙන යනු ලබන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව පවත්වාගෙනයාමට උපකාරී වන අතර, ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති වඩාත් හොඳින් කරගෙන යාමට ද උපකාරී වනු ඇත.

## 1.2 2010 වසරේ සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායීතාව සහ ප්‍රතිපත්ති සඳහා ප්‍රතිචාර

### මූර්ත අංශයේ වර්ධනයන්

පසුගිය දශක තුනක කාලය තුළ පැවැති ඉහළම වාර්ෂික ආර්ථික වර්ධනය අත්කර ගනිමින් 2010 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 8.0 ක ආකර්ෂණීය වර්ධනයක් වාර්තා කළේය[1]. 1977 දී

[1] මීට පෙර 1968 සහ 1978 වර්ෂවල දී ශ්‍රී ලංකා ආර්ථිකයේ සියයට 8.2 ක වර්ධනයක් වාර්තා කර ඇත.

**1.1 සංඛ්‍යා සටහන** **කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2002) යටතේ දළ ජාතික නිෂ්පාදිතය**

| අංශය | වටිනාකම (රු. මිලියන) | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | | වෙනස්වීමේ අනුපාතිකය% | | වෙනස්වීමට දායකත්වය% | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) |
| **කෘෂිකාර්මික අංශය** | **295,097** | **315,644** | **12.0** | **11.9** | **3.2** | **7.0** | **11.0** | **10.5** |
| කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය | 266,208 | 283,236 | 10.9 | 10.7 | 2.8 | 6.4 | 8.8 | 8.7 |
| ධීවර කර්මාන්තය | 28,888 | 32,407 | 1.2 | 1.2 | 6.9 | 12.2 | 2.2 | 1.8 |
| **කාර්මික අංශය** | **701,129** | **760,219** | **28.6** | **28.7** | **4.2** | **8.4** | **33.9** | **30.1** |
| පතල් හා කැණීම් | 52,030 | 60,079 | 2.1 | 2.3 | 8.2 | 15.5 | 4.7 | 4.1 |
| නිෂ්පාදන කර්මාන්ත | 427,334 | 458,660 | 17.4 | 17.3 | 3.3 | 7.3 | 16.3 | 16.0 |
| විදුලිය, ගෑස් සහ ජලය | 58,974 | 63,567 | 2.4 | 2.4 | 3.7 | 7.8 | 2.5 | 2.3 |
| ඉදිකිරීම් | 162,790 | 177,912 | 6.6 | 6.7 | 5.6 | 9.3 | 10.3 | 7.7 |
| **සේවා අංශය** | **1,452,988** | **1,569,569** | **59.3** | **59.3** | **3.3** | **8.0** | **55.2** | **59.4** |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 570,698 | 613,320 | 23.3 | 23.2 | -0.2 | 7.5 | -1.4 | 21.7 |
| හෝටල් සහ ආපනශාලා | 9,901 | 13,845 | 0.4 | 0.5 | 13.3 | 39.8 | 1.4 | 2.0 |
| ප්‍රවාහනය සහ සන්නිවේදනය | 329,578 | 368,653 | 13.5 | 13.9 | 6.3 | 11.9 | 23.4 | 19.9 |
| බැංකු, රක්‍ෂණ සහ දේපල වෙළෙඳාම් යනාදිය | 217,819 | 234,255 | 8.9 | 8.9 | 5.7 | 7.5 | 14.1 | 8.4 |
| නිවාස අයිතිය | 74,051 | 74,692 | 3.0 | 2.8 | 1.3 | 0.9 | 1.1 | 0.3 |
| රාජ්‍ය සේවා | 191,778 | 202,187 | 7.8 | 7.6 | 5.9 | 5.4 | 12.8 | 5.3 |
| පෞද්ගලික සේවා | 59,164 | 62,617 | 2.4 | 2.4 | 5.8 | 5.8 | 3.9 | 1.8 |
| **දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **2,449,214** | **2,645,432** | **100.0** | **100.0** | **3.5** | **8.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | -28,262 | -33,931 | | | 49.8 | -20.1 | | |
| **දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.)** | **2,420,952** | **2,611,500** | | | **4.8** | **7.9** | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ලිහිල්කරණයෙන් පසුව පැවති සියයට 4.9 ක් වූ සාමාන්‍ය වාර්ෂික වර්ධනයට සාපේක්ෂව මෙය විශිෂ්ට වර්ධනයක් වේ. මෙම ඉහළ ආර්ථික වර්ධනය අත්කර ගැනීමට උපකාරී වූ සාධක වූයේ ආර්ථික කටයුතු වර්ධනය සඳහා යහපත් වාතාවරණයක් ඇති කරමින් තිරසාර සාමයක් ස්ථාපිත කිරීම, ශක්තිමත් සාර්ව ආර්ථික පරිසරය, දේශීය ඉල්ලුම ඉහළ යාම, යටිතල පහසුකම් සංවර්ධනය සහ ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථාතත්ත්වයට පත්වීමත් සමග විදේශීය ඉල්ලුම ඉහළ යාම සහ හිතකර දේශීය කාලගුණික තත්ත්වයන්ය.

**ආර්ථිකයෙහි සියලුම ප්‍රධාන අංශයන්හි යහපත් ක්‍රියාකාරිත්වය 2010 වසරේ ඉහළ ආර්ථික වර්ධනයට දායක විය.** 2010 දී ද.දේ.නි.යෙන් සියයට 11.9 ක පමණ දායකත්වයක් සැපයූ කෘෂිකාර්මික අංශය, 2009 වසරේ පැවති සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව සියයට 7 කින් වර්ධනය විය. 2010 වසරේ මෙම ඉහළ වර්ධනයට වී, තේ, රබර් සහ සුළු අපනයන බෝගවල නිෂ්පාදනය ඉහළයාම සමග ධීවර අංශයේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළයාම හේතු විය. කෙසේ වුවද, පසුගිය වසරවල පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන්හි පසු බලපෑම පෙන්නුම් කරමින් පොල් නිෂ්පාදනය සියයට 19 කින් අඩු විය. ආයෝජක සහ පාරිභෝගික විශ්වාසය වර්ධනය වීමත් සමග දේශීය සහ විදේශීය ඉල්ලුම ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත අංශය සියයට 8.4 ක සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කළේය. ආහාර පාන, රබර් නිෂ්පාදිත, රෙදිපිළි සහ ඇඟළුම් යන කර්මාන්තවල ක්‍රියාකාරිත්වයේ වැඩිදියුණුවීම මෙන්ම ඉදිකිරීම් අංශයේ සිදුවූ වර්ධනය සහ ජල විදුලිය උත්පාදනය ඉහළ යාම මෙම වර්ධනයට හේතුවිය. 2010 වසර තුළ ද.දේ.නි.යට කාර්මික අංශයේ දායකත්වය සියයට 28.7 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. 2010 වසරේ දී සේවා අංශය සියයට 8.0 කින් වර්ධනය විය. සේවා අංශයට ඉහළම දායකත්වය සපයන තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය, දේශීය සහ විදේශීය වෙළෙඳාම් කටයුතුවල සිදු වූ වර්ධනයත් සමග සියයට 7.5 කින් වර්ධනය විය. සංචාරක ක්ෂේත්‍රයේ සිදු වූ ශීඝ්‍ර වර්ධනයත් සමග හෝටල් සහ ආපනශාලා උප අංශය සියයට 39.8 කින් පමණ සැලකිය යුතු ලෙස වර්ධනය විය. ප්‍රවාහනය සහ සන්නිවේදනය, බැංකු රක්ෂණ සහ දේපළ වෙළෙඳාම යන සෙසු උප අංශයන් 2009 වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයන් වාර්තා කළේය.

**2009 හි ආර්ථික කටයුතු පහත බැසීම නිසා සියයට 5.8 ක් ලෙස පැවති සේවා වියුක්ති අනුපාතය ආර්ථික කටයුතුවල වර්ධනයත් සමග සේවා නියුක්ති අවස්ථාවන්වල ඇති වූ ප්‍රසාරණය පෙන්නුම් කරමින්**

**2010 දී සියයට 4.9 දක්වා 2008 වසරේ දී පැවති මට්ටමට වඩා අඩු මට්ටමක් දක්වා අඩුවිය.** 2009 වසරේ දී සියයට 48.7 ක්ව පැවැති ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය 2010 වසරේ දී සියයට 48.1 දක්වා සුළු වශයෙන් අඩු වූ අතර, 2010 වසරේ දී සේවා නියුක්තිකයින් සංඛ්‍යාව මිලියන 7.71 දක්වා සියයට 1.4 කින් වර්ධනය විය. සමස්ත සේවා නියුක්තියට සේවා අංශය දැක්වූ දායකත්වය 2009 වසරේ දී පැවැති සියයට 42.3 සිට 2010 වසරේ දී සියයට 43.1 දක්වා වර්ධනය වූ අතර, කර්මාන්ත අංශයෙහි දායකත්වය සියයට 25.1 සිට සියයට 24.2 දක්වා පහත වැටුණි. සේවා නියුක්තියේ ස්වභාවය අනුව සැලකූ විට ස්වයංරැකියාවන්හි නියුක්ත වූවන්ගේ ප්‍රතිශතය වර්ධනය විය. කෙසේ වුවද, විශේෂයෙන් තරුණ උගතුන් ඇතුළු තරුණ පිරිස අතර පවතින සාපේක්ෂව ඉහළ සේවා වියුක්තිය සැලකිල්ලට ලක්විය යුතු කරුණක් ලෙස තවදුරටත් පවතී.


**කෘෂිකාර්මික අංශයෙහි ඉහළ වර්ධනය, අපනයන සහ දේශීය කෘෂිකර්මය යන දෙඅංශයෙන්ම පෙන්නුම් කෙරේ.** තේ නිෂ්පාදනයෙහි 2009 වසරේ පැවති අඩුවීමට සාපේක්ෂව, 2010 වසරේ දී එහි මෙතෙක් වාර්තා වූ ඉහළම නිෂ්පාදන මට්ටම පෙන්නුම් කරමින් කිලෝ ග්‍රෑම් මිලියන 329 ක් වූ අතර, රබර් නිෂ්පාදනය ද අඛණ්ඩව වැඩි විය. 2010 වසරේ දී කරාබුනැටි, ගම්මිරිස් සහ කුරුඳු වැනි සෙසු අපනයන බෝගයන් ද කෘෂිකර්ම අංශයේ ඉහළ වර්ධනයට ධනාත්මක දායකත්වයක් සැපයීය. උතුරු සහ නැගෙනහිර පළාත්වල වගා ඉඩම් ප්‍රමාණය ඉහළ යාම, හිතකර කාලගුණික තත්ත්වය සහ කෘෂි සහන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක වීම හේතුවෙන් 2010 වසරේ දී දේශීය කෘෂිකාර්මික අංශය තුළ, වී නිෂ්පාදනය ආකර්ෂණීය වර්ධනයක් වාර්තා කළේය. 2010 වසරේ දී පොල් නිෂ්පාදනය සියයට 19 කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, සීනි නිෂ්පාදනය සුළු වශයෙන් අඩු විය. 2010 වසරේ දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 12 කින් වැඩි වූ අතර, උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ධීවර කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දරන ලද ඉමහත් පරිශ්‍රමය හේතුවෙන් දේශීය කිරි නිෂ්පාදනය ඉහළ ගියේය.

**2010 වසරේ දී ප්‍රධාන කෘෂි නිෂ්පාදනවල මිල ගණන් ඉහළ මට්ටමකට පැවතුණි.** ශ්‍රී ලංකා තේ සඳහා ඉල්ලුම ඉහළයාමත් සමග ඉතිහාසයේ වාර්තා වූ ඉහළම තේ මිල ගණන් කොළඹ තේ වෙන්දේසියේ දී වාර්තා විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ස්වභාවික රබර් සැපයුමේ පැවැති සැලකිය යුතු හිඟය, බොරතෙල් මිල ඉහළ මට්ටමක පැවතීම හා ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම හේතුවෙන් ඉහළ ගිය ඉල්ලුම හේතුකොට ගෙන සියලුම රබර් ප්‍රභේදයන්ගේ සාමාන්‍ය මිල ගණන් ඉහළ ගියේය. පොල් නිෂ්පාදනයේ අඩුවීම සහ පොල් ආශ්‍රිත කර්මාන්ත වෙතින් පොල් සඳහා ඉල්ලුම ඉහළ යාම වසර තුළ දී පොල් මිල සැලකිය යුතු ලෙස ඉහළ යාමට හේතු විය. දෙකන්නයේදීම වී නිෂ්පාදනය ඉහළ මට්ටමක පැවතියදීත්, වී මිල දී ගැනීමේ වැඩ පිළිවෙළ හරහා රජය සිදුකළ මැදිහත්වීම, වී මිල ස්ථායී කිරීමට උපකාරී විය. කිරි නිෂ්පාදනය ධෛර්යමත් කිරීම සඳහා දියර කිරි සඳහා වන සාමාන්‍ය නිෂ්පාදන මිල ඉහළ නංවන ලදී.

**2010 වසර තුළ දී කෘෂිකාර්මික අංශයේ ප්‍රගතිය සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය.** තේ නැවත වගාවන් සහ නව වගාවන් ධෛර්යමත් කිරීමට කුඩා තේ වතු හිමියන් සඳහා ලබාදෙන සහනදායී අරමුදල් ප්‍රමාණය ඉහළ නංවන ලද අතර, පොල් නැවත වගාවන් සහ නව වගාවන් සඳහා ද සහනාධාර ඉහළ නංවන ලදී. රජයට ඉහළ වියදමක් දැරීමට සිදුවුවද, පොහොර සහන වැඩපිළිවෙළ අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, එය 2011 වසරේ සිට පොල් සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග සඳහා ද ව්‍යාප්ත කරන ලදී. ඉහළ ඵලදායිතාවෙන් යුතු බීජ සැපයීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය පෞද්ගලික හවුල් ක්‍රියාකාරිත්ව පදනමක් යටතේ තුන් අවුරුදු බීජ වගා සංවර්ධන වැඩපිළිවෙළක් යෝජනා වී ඇත.

**කාර්මික අංශයේ සමස්ත නිෂ්පාදනය 2009 වසරේ පැවැති සියයට 4.2 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 8.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** සමස්ත කාර්මික නිෂ්පාදනයට සියයට 54.6 ක පමණ දායකත්වයක් සපයන කර්මාන්තශාලා නිෂ්පාදනය 2010 වසරේ දී සියයට 7.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ගෝලීය ආර්ථික අර්බුදයෙන් දැඩි ලෙස බලපෑමට ලක්වූ රෙදිපිළි, ඇඟළුම් සහ සම්

**1.3 රූප සටහන** — **ඉතිරිකිරීම් සහ ආයෝජන (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**



**1.2 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් ආයෝජන පරතරය**

| ශීර්ෂය | රු. බිලියන | | වර්ධනය % | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) | 2009 (අ) | 2010 (ආ) |
| **1. දේශීය ඉල්ලුම** | **5,149.2** | **6,114.1** | **2.7** | **18.7** | **106.5** | **109.1** |
| 1.1 පරිභෝජනය | 3,967.8 | 4,557.3 | 4.4 | 14.9 | 82.1 | 81.3 |
| පෞද්ගලික | 3,116.2 | 3,684.7 | 1.0 | 18.2 | 64.4 | 65.8 |
| රාජ්‍ය | 851.5 | 872.6 | 19.3 | 2.5 | 17.6 | 15.6 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 1,181.4 | 1,556.8 | -2.8 | 31.8 | 24.4 | 27.8 |
| පෞද්ගලික | 863.5 | 1,209.6 | -7.1 | 40.1 | 17.9 | 21.6 |
| රාජ්‍ය | 318.0 | 347.2 | 11.1 | 9.2 | 6.6 | 6.2 |
| **2. ශුද්ධ බාහිර ඉල්ලුම** | **-313.9** | **-511.8** | **48.0** | **-63.0** | **-6.5** | **-9.1** |
| භාණ්ඩ හා සේවා අපනයන | 1,031.3 | 1,215.0 | -5.9 | 17.8 | 21.3 | 21.7 |
| භාණ්ඩ හා සේවා ආනයන | 1,345.2 | 1,726.8 | -20.8 | 28.4 | 27.8 | 30.8 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි) (1+ 2)** | **4,835.3** | **5,602.3** | **9.6** | **15.9** | **100.0** | **100.0** |
| **4. දේශිය ඉතිරි කිරීම් (3-1.1)** | **867.5** | **1,045.0** | **41.8** | **20.5** | **17.9** | **18.7** |
| පෞද්ගලික | 1,047.5 | 1,163.8 | 49.6 | 11.1 | 21.7 | 20.7 |
| රාජ්‍ය | -179.9 | -118.9 | -103.3 | 33.9 | -3.7 | -2.1 |
| **5. විදේශීය ශුද්ධ සාධක ආදායම** | **-55.8** | **-71.9** | **46.9** | **-28.8** | **-1.2** | **-1.3** |
| **6. විදේශීය ශුද්ධ පෞද්ගලික ජංගම සංක්‍රාම** | **336.6** | **408.0** | **21.2** | **21.2** | **7.0** | **7.3** |
| **7. ජාතික ඉතිරි කිරීම් (4+5+6)** | **1,148.3** | **1,381.1** | **46.4** | **20.3** | **23.7** | **24.7** |
| **8. ඉතිරි කිරීම් ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම් - ආයෝජන (4-1.2) | -313.9 | -511.8 | | | -6.5 | -9.1 |
| ජාතික ඉතිරි කිරීම් - ආයෝජන (7-1.2) | -33.1 | -175.7 | | | -0.7 | -3.1 |
| **9. නිල ප්‍රදානයන් හැර විදේශීය ජංගම ගිණුම් හිගය (2+5+6) (ඇ)** | **-33.1** | **-175.7** | | | **-0.7** | **-3.1** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයන්වලින් වෙනස් වනුයේ ගණනය කිරීමේදී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදිත අංශය 2010 අගෝස්තු මස සිට බලපවත්වන පරිදි GSP+ සහනය අහිමි වුවද, වසරේ අවසාන කාර්තුවේ දී ශක්තිමත් ලෙස යථාතත්ත්වයට පත්වන බව පෙන්නුම් කෙරිණි. ඵලදායීතාවය ඉහළ යාම, නිෂ්පාදනවල ඉහළ ගුණාත්මකභාවය, විවිධාංගීකරණය හා විදේශ ඉල්ලුම ක්‍රමිකව යථාතත්ත්වයට පත්වීම හේතුවෙන් ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තයේ තරඟකාරී බව ආරක්ෂා විය. ප්‍රධාන වශයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල දායකත්වය හේතුවෙන් සහ වසර තුළ දී සංචාරක කටයුතුවල ඇතිවූ වර්ධනය හේතුවෙන් දේශීය ඉල්ලුමේ ඇති වූ ප්‍රසාරණය, කර්මාන්ත ශාලා නිෂ්පාදන අංශයෙහි, සියයට 48.0 කට දායකත්වයක් සපයන ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අංශයේ ඉහළ වර්ධනයට හේතු විය. කර්මාන්ත නිෂ්පාදන වර්ධනයට දායක වූ අපනයන වෙළෙඳපොළ පදනම් කරගත් කර්මාන්ත වූයේ, නැව් නිෂ්පාදනය සහ අළුත්වැඩියාව, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍ර-සූත්‍ර නිෂ්පාදන කර්මාන්තයන්ය. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ සිමෙන්ති සඳහා වූ ඉහළ ඉල්ලුමත් සමග ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන අංශය 2010 වසරේ දී යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ජල විදුලි උත්පාදනයේ සැලකිය යුතු ඉහළයාමත් සමග විදුලිබල අංශයේ එකතුකළ අගය වැඩි වූ අතර, ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතු ඉහළයාමත් සමග ඉදිකිරීම් අංශය සියයට 9.3 කින් වර්ධනය විය.

**දේශීය සහ විදේශීය ඉල්ලුම යථාතත්ත්වයට පත්වීම සහ හිතකර සාර්ව ආර්ථික පරිසරය 2010 වසරේ කාර්මික අංශයේ වර්ධනයට උපකාරී විය.** උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉල්ලුම ඉහළ යාමත් සමග දේශීය ආර්ථික කටයුතු යථාතත්ත්වයට පත්වීම, පොලී අනුපාතික අඩු මට්ටමක පැවතීම, උද්ධමනය අඩු මට්ටමක පැවතීම සහ ව්‍යාපාරික හා පාරිභෝගික

විශ්වාසය ඉහළ යාම යනාදිය 2010 වසර තුළ දේශීය වෙළෙඳපොළ පදනම් කරගත් කර්මාන්තයන්හි වර්ධනය සඳහා හිතකර ආර්ථික පරිසරයක් නිර්මාණය කරන ලදී. ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථාතත්ත්වයට පත්වීම, ඵලදායීතාවය වැඩිදියුණු කිරීම, සන්නම් අලෙවිකරණය සඳහා උපායශීලී වීම, වෙළෙඳපොළ විවිධාංගීකරණ උපායමාර්ග සහ නිෂ්පාදන කළඹ පුළුල්වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කාර රටවල්වල ඉල්ලුමේ ඉහළ යාම අපනයන වෙළෙඳපොළ පදනම් කරගත් කර්මාන්ත සඳහා වාසිදායක විය. රටේ විවිධ පළාත්වල කාර්මික ජනපද සංවර්ධනය කිරීම, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය කිරීම සහ දේශීය අගය එකතු කිරීමේ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපාදන ලබාදීම යනාදිය මගින් කාර්මික අංශයේ වර්ධනය වේගවත් කිරීම හා ප්‍රාදේශීය අංශයට කර්මාන්ත යොමු කිරීම සඳහා රජය විවිධ පියවරයන් ගෙන ඇත.

**දළ දේශීය නිෂ්පාදිතයට සියයට 59.3 ක දායකත්වයක් ලබාදුන් සේවා අංශය 2009 දී පැවති සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2010 වසරේ දී සියයට 8.0 කින් වර්ධනය විය.** විදේශීය වෙළෙඳපොළවල්, ක්‍රමිකව යථාතත්ත්වයට පත්වීම සමග විදේශීය වෙළෙඳාමේ ශීඝ්‍ර වර්ධනය සහ සාමය ස්ථාපිත කිරීමත් සමග දේශීය වෙළෙඳාම වේගවත්ව වර්ධනය වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළෙඳාම් අංශය 2009 වසරේ පැවැති ඍණ වර්ධනයෙන් යථාතත්ත්වයට පත්වී 2010 වසරේ දී ආකර්ෂණීය වර්ධනයක් පෙන්නුම් කළේය. විදේශ සංචාරකයන්ගේ පැමිණීම් යළි ඉහළ යාම සහ දේශීය සංචාරක ක්ෂේත්‍රයේ ඉහළයාම සමග හෝටල් සහ ආපනශාලා උප අංශය ආකර්ෂණීය වර්ධනයක් පෙන්නුම් කළේය. ප්‍රවාහන, ගුවන්, නැව් බඩු මෙහෙයුම් සහ සන්නිවේදන ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වැඩි දියුණුවීමත් සමග ප්‍රවාහන සහ සන්නිවේදන අංශය වර්ධනය විය. ආයෝජන සහ ණයදීම්, විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සහ බැංකු ශාඛා හා වෙනත් සේවා මධ්‍යස්ථාන ව්‍යාප්තිය හරහා මූල්‍ය සේවාවන් පුළුල් කිරීම තුළින් ආදායම ඉහළ යාම, බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් උප අංශය ප්‍රසාරණය වීමට හේතු විය.

**ආර්ථික කටයුතු යථාතත්ත්වයට පත්වීම පිළිඹිබු කරමින් පාරිභෝගික වියදම 2010 වසරේදී සියයට 14.9 කින් වර්ධනය වූ අතර, රටෙහි ඉතුරුම් සහ ආයෝජන යන දෙඅංශයම යථාතත්ත්වයට පත් විය.** ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික පරිභෝජනය 2009 දී සියයට 64.4 සිට 2010 දී සියයට 65.8 දක්වා ඉහළ ගිය අතර, රජයේ පරිභෝජනය සියයට 17.6 ක ඉහළ මට්ටමක සිට සියයට 15.6 දක්වා අඩුවිය. දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් යන දෙඅංශයම 2009 දී පිළිවෙලින් ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 17.9 සහ සියයට 23.7 සිට 2010 දී පිළිවෙලින් සියයට 18.7 ක් සහ 24.7 ක් දක්වා ඉහළ ගියේය. පෞද්ගලික ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවැති 17.9 සිට 2010 වසරේ දී සියයට 21.6 දක්වා වර්ධනය වීම සහ රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2009 පැවැති සියයට 6.6 සිට 2010 වසරේ දී සියයට 6.2 දක්වා සුළු වශයෙන් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත ආයෝජන සියයට 27.8 ක් දක්වා වර්ධනය විය. සමස්ත ආයෝජනය යථා තත්ත්වයට පත්වීම ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 3.1 ක ජාතික ඉතුරුම් සහ ආයෝජන පරතරයකට හේතු වූ අතර, මෙය විදේශීය ජංගම ගිණුම් හිඟයෙන්ද පිළිඹිබු විය.

**පාරිභෝගික මිල උද්ධමනය 2010 වසරේ දී මැදි තනි අංකයක අඛණ්ඩව පැවැති අතර, 2010 වසර අවසානයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද 2002 = 100) මත ගණනය කරනු ලබන සාමාන්‍ය වාර්ෂික උද්ධමනය පිළිවෙළින් සියයට 5.9 ක් හා සියයට 6.9 ක් විය.** දේශීය සැපයුම් තත්ත්වයේ වර්ධනය, ආනයන බදු සංශෝධනය සහ පාලන මිල ගණන් අඩු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හරහා ලැබුණු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය සහයෝගය මෙන්ම විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තිය, වසර පුරා සාපේක්ෂ වශයෙන් පහළ හා ස්ථායී උද්ධමනයක් පැවතීමට හේතු විය.


## විදේශීය අංශයේ වර්ධනයන්

**හිතකර දේශීය සහ විදේශීය සංවර්ධනයත් සමඟ 2010 වසරේ දී විදේශීය අංශය තවදුරටත් වර්ධනය විය.** 2010 ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් “මැදි ආදායම්ලාභී නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයක්” පවතින රටක් බවට ශ්‍රී ලංකාව උසස් කිරීම හේතුවෙන් රටෙහි ප්‍රතිරූපය ශක්තිමත්ව ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල විද්‍යමාන විය. ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම, ජා.මු.අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සාර්ථකව ක්‍රියාත්මක වීම, 2010 ඔක්තෝබර් මාසයේ දී තෙවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සාර්ථකව සිදු කිරීම ද ඇතුළුව රජය වෙත ලැබුණු දීර්ඝකාලීන ප්‍රාග්ධන ප්‍රවාහයන් සහ පෞද්ගලික අංශය වෙත ලැබුණු මූල්‍ය ප්‍රවාහයන් ඉහළයාම යනාදිය විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා තවදුරටත් උපකාරී විය. විදේශ විනිමය ගනුදෙනු

සඳහා බලපැවැත්වුනු සීමාකම් තවදුරටත් ලිහිල් කිරීම ද ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීමට සහ විදේශීය අංශයේ සංවර්ධනයට පිටිවහලක් විය.

**2009 වසරේ පැවති ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් ඇති වූ තියුණු පසුබෑමෙන් පසු 2010 වසරේ දී විදේශීය වෙළෙඳාම ශක්තිමත් ලෙස යථාතත්ත්වයට පත් විය.** කාර්මික සහ කෘෂිකාර්මික අපනයන ඉපැයීම් ඉහළයාම හේතුකොටගෙන, අපනයන ඉපැයීම් සියයට 17.3 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ආනයන වියදම් සියයට 32.8 කින් වර්ධනය වූ අතර, අන්තර් භාණ්ඩ ආනයන ඉහළයාම මෙයට වැඩි වශයෙන්ම හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2010 දී වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 5,205 ක් දක්වා පුළුල් විය. වසරේ මුල් කාලය තුළදී, ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමේ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ අපනයන ආදායම විචලනය වූ අතර, වසරේ අවසාන භාගයේ දී GSP+ බදු සහන ඉවත් කරනු ලැබුව ද නව වර්ධන මාවතක් පෙන්නුම් කරමින් අපනයන ආදායම් ඉහළ නැගුණි. සාමකාමී ආර්ථික පසුබිමේ ප්‍රතිලාභ මෙන්ම දේශීය අපනයනකරුවන් අපනයන ඉහළ නැංවීම සඳහා කැපවීමෙන් ක්‍රියාකිරීම මෙමගින් පෙන්නුම් කෙරේ. මේ අතර, ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම, නැගී එන රටවලින් භාණ්ඩ සඳහා වන ඉල්ලුම විශාල වශයෙන් වැඩිවීම සහ ගෝලීය අපනයන සැපයුම් සංරෝධක හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩ මිල ඉහළ නැගුණි. මේ අනුව, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ කෘෂිකාර්මික අපනයන සඳහා ඉහළ මිල ගණන් පැවතුණි. 2010 දී ආනයන වියදම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වුයේ විශේෂයෙන්ම ඛනිජ තෙල් මිල ගණන් වැනි භාණ්ඩ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීමයි. ආනයන තීරු බදු අඩු කිරීම සහ දේශීය ආර්ථික කටයුතු වර්ධනය

**1.4 රූප සටහන** **ඛනිජ තෙල් ආනයන වටිනාකම සහ ආනයනය කරන ලද බොර තෙල්වල සාමාන්‍ය මිල**




වීම හේතුවෙන් පෞද්ගලික මෝටර් රථ වාහන සහ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ වැනි දිගු කල් පවතින පාරිභෝගික භාණ්ඩ ආනයනය ද වැඩි විය. එසේම ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍ර-සූත්‍ර සහ උපකරණ ආනයනය සඳහා වූ ඉහළ වියදම පෙන්නුම් කරමින් 2010 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයනය ද වැඩි විය.

**2010 වසර තුළ දී ඉහළ අතිරික්තයක් පෙන්නුම් කරමින් විදේශ සේවා වෙළෙඳාම කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, ආදායම් ගිණුමෙහි තවදුරටත් හිඟයක් වාර්තා විය.** සේවා ගිණුමේ සියලුම උප අංශයන්, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන, සංචාරක, පරිගණක සහ තොරතුරු, ඉදිකිරීම් සහ රක්ෂණ යනාදි සේවා වසර තුළ දී සාර්ථක ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී. වරාය සහ ගුවන් සේවා යන අංශයන්ගෙන් ලද ඉහළ ආදායම් සහ සංචාරකයින්ගේ පැමිණීම් ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ප්‍රවාහන සහ සංචාරක සේවාවන්හි ශුද්ධ ආදායම සැළකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, ආයෝජන මත ඉපැයූ පොලී ආදායම් මෙන්ම විදේශ විනිමය සහ විදේශීය සුරැකුම්පත් වෙළෙඳාමෙන් ඉපැයූ ලාභ ඉක්මවා, විදේශිකයින් සිය රටවල් කරා ගෙනයන ලද ඔවුන් විසින් මෙරට ව්‍යාපාරවලින් ඉපැයූ ලාභ සහ ලාභාංශ ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් 2010 වසරේ දී ආදායම් ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් 572 දක්වා වැඩි විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් බිලියන 4.1 දක්වා සැළකිය යුතු ලෙස ඉහළ යාම, 2010 වසරේ වෙළෙඳ හිඟය විශාල ලෙස ආවරණය කිරීමට උපකාරී විය.** සේවා යෝජකයින් සමග ඉහළ වැටුප් ගෙවීම් සම්බන්ධව සාමුහික සම්මුතීන්ට එළඹීම, වාණිජ බැංකු සතු විනිමය හුවමාරු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව ව්‍යාප්ත කිරීම, ඉහළ වැටුප් සහිත විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයන් දිරිමත් කිරීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ විධිමත් මාර්ග ඔස්සේ ලැබීම ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල නව බැංකු ශාඛා විවෘත කිරීම යනාදිය විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ආකර්ෂණය කරගැනීම සඳහා විශාල වශයෙන් හේතු විය.

**2010 වසරේ දී ජංගම ගිණුමේ එ.ජ.ඩොලර් මිලියන 1,498 ක හිඟයක් වාර්තා කළ අතර, එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.9 ක් විය.** දේශීය ඉල්ලුම යථාතත්ත්වයට පත්වීම සහ ආර්ථික කටයුතු තවදුරටත් වර්ධනයවීම හේතුවෙන් ආනයන සඳහා ඉල්ලුම ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස

**1.3 සංඛ්‍යා සටහන** **විදේශීය අංශයේ ප්‍රවණතා**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන 2009 (අ) | එ.ජ.ඩොලර් මිලියන 2010 (ආ) | වර්ධනය % |
|---|---|---|---|
| **අපනයන** | **7,085** | **8,307** | **17.3** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 1,690 | 2,041 | 20.8 |
| කාර්මික නිෂ්පාදන | 5,305 | 6,173 | 16.4 |
| ඛනිජමය අපනයන | 89 | 93 | 4.4 |
| වෙනත් අපනයන | - | - | - |
| **ආනයන** | **10,207** | **13,512** | **32.4** |
| පාරිභෝගික භාණ්ඩ | 1,972 | 2,870 | 45.6 |
| අතරමැදි භාණ්ඩ | 5,669 | 7,496 | 32.2 |
| ආයෝජන භාණ්ඩ | 2,451 | 2,970 | 21.2 |
| වෙනත් | 115 | 176 | 53.2 |
| **වෙළෙඳ ශේෂය** | **-3,122** | **-5,205** | **66.7** |
| **සේවා (ශුද්ධ)** | **391** | **698** | **78.5** |
| ලැබීම් | 1,892 | 2,468 | 30.5 |
| ගෙවීම් | 1,501 | 1,770 | 18.0 |
| **ආදායම් (ශුද්ධ)** | **-488** | **-572** | **17.2** |
| ලැබීම් | 116 | 323 | 178.7 |
| ගෙවීම් | 603 | 895 | 48.5 |
| **ජංගම සංක්‍රාම (ශුද්ධ)** | **3,005** | **3,660** | **21.8** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 2,927 | 3,608 | 23.3 |
| ලැබීම් | 3,330 | 4,116 | 23.6 |
| ගෙවීම් | 403 | 508 | 26.1 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 77 | 52 | -31.9 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-214** | **-1,418** | **562.8** |
| **ප්‍රාග්ධන ගිණුම** | **233** | **164** | **-29.7** |
| **මූල්‍ය ගිණුම** | **2,361** | **2,713** | **14.9** |
| සෘජු ආයෝජන (ශුද්ධ) | 384 | 435 | 13.3 |
| ලැබීම් | 404 | 478 | 18.2 |
| ගෙවීම් | 20 | 43 | 112.5 |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | 79 | 149 | 88.0 |
| ලැබීම් | 390 | 580 | 48.6 |
| ගෙවීම් | 311 | 431 | 38.6 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ) | 840 | 1,796 | 113.8 |
| ලැබීම් | 1,780 | 2,460 | 38.2 |
| ගෙවීම් | 940 | 665 | -29.3 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | -311 | -198 | -36.4 |
| එයින්: විවිධ ආයෝජන (ශුද්ධ) | -6 | -230 | 3728.9 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ) | 1,369 | 531 | -61.2 |
| වැරදීම් සහ අත්හැරීම් | 346 | -537 | |
| **සමස්ත ශේෂය** | **2,725** | **921** | |
| දළ නිල වත්කම් (ඇ) | 5,097 | 6,610 | |
| ආනයන මාස ගණන | 6.0 | 5.9 | |
| මුළු විදේශ වත්කම් (ඇ) | 6,770 | 8,035 | |
| ආනයන මාස ගණන | 8.0 | 7.1 | |
| අපනයන මිල දර්ශකය | 112.5 | 124.9 | |
| ආනයන මිල දර්ශකය | 109.1 | 127.9 | |
| වෙළෙඳ අනුපාතය | 103.1 | 97.6 | |
| **විනිමය අනුපාත (සාමාන්‍යය)** | | | අධිප්‍රමාණ (+)/ අවප්‍රමාණ(-) |
| රුපියල්/එ.ජ.ඩොලර් | 114.94 | 113.06 | 1.7 |
| රුපියල්/ජපන් යෙන් | 1.23 | 1.29 | -4.6 |
| රුපියල්/යුරෝ | 160.21 | 150.10 | 6.7 |
| රුපියල්/බ්‍රිතාන්‍ය පවුම් | 179.87 | 174.81 | 2.9 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ඇතුළත් නොවේ.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළෙඳ ගිණුමේ හිඟය පුළුල්වීම නිසා ජංගම ගිණුමේ හිඟය වැඩි විය. කෙසේවෙතත් ගෝලීය ආර්ථික අවපාතය හමුවේ විදේශීය හා දේශීය ඉල්ලුමේ දුර්වල ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරමින් ජංගම ගිණුමේ හිඟය ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.5 ක අඩු මට්ටමක පැවතුණු 2009 වසර හැර පෙර වසර කිහිපය සමඟ සැසඳීමේ දී 2010 වසරේ ජංගම ගිණුමේ හිඟය සැළකිය යුතු අඩු මට්ටමක පවතී.

**ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුමේ ලැබීම් ප්‍රවාහ ජංගම ගිණුමේ හිඟය ඉක්මවන ලදී.** රජය වෙත ලැබුණු මැදි හා දිගුකාලීන ණය ප්‍රවාහ 2009 වසරට සාපේක්ෂව 2010 වසරේ දී ඉහළ ගිය අතර, විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා විදේශීය ණය මුදාහැරීම් වේගවත්වීම ප්‍රධාන වශයෙන් හේතු විය. වසර 10 ක පරිණත කාලයක් සහිත එ.ජ.ඩොලර් බිලියන 1 ක් වූ තෙවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව 2010 ඔක්තෝබර් මස සාර්ථකව සිදු කරන ලදී. කෙසේ වුවත්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායන්ට ලැබෙන ණය ඇතුළත් විදේශීය සෘජු ආයෝජන 2010 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 516 ක් දක්වා තවදුරටත් පහළ ගිය අතර, මේ සඳහා ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් විදේශීය මූල්‍ය ප්‍රවාහ මත ඇති කළ බලපෑම ප්‍රධාන වශයෙන් හේතු විය. රජයේ රුපියල් සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ලැබීම්, 2010 වසරේ දී පහළ ගිය අතර, විදේශිකයන්ට නිකුත් කළ නොපියවූ රාජ්‍ය සුරැකුම්පත්වල වටිනාකම රාජ්‍ය සුරැකුම්පත්වල මුළු නොපියවූ වටිනාකමින් සියයට 10 ක් වූ අවසර ලද උපරිම මට්ටම කරා ළඟාවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2010 වසරේ දී පෞද්ගලික අංශය වෙත ලැබුණු විදේශීය ණය ලැබීම් ප්‍රවාහ ඉහළ ගියේය. කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගෙවීම් පහළ ගිය අතර, වාණිජ බැංකු සතු විදේශීය වත්කම් පහළ යාම සහ 2010 වසරේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විශාල ඛනිජ තෙල් ආනයන බිල්පත් ආපසු ගෙවීම් පැවතියද විදේශීය වගකීම් ඉහළ යාම මීට මූලික වශයෙන් හේතු විය.

**2009 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 2,725 ක ඉහළ ගෙවුම් තුලන අතිරික්තයට පසුව 2010 වසරේ දී ද එ.ජ.ඩොලර් මිලියන 921 ක අතිරික්තයක් වාර්තා විය.** ජංගම ගිණුමේ හිඟය ඉක්මවමින් ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම වෙත මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය වීම හේතුවෙන් ගෙවුම් තුලනයේ සමස්ත ශේෂයෙහි අතිරික්තයක් වාර්තා විය. තවද, ගෙවුම් තුලන අතිරික්තය සඳහා රජය ලද මූල්‍ය ප්‍රවාහ මෙන්ම පෞද්ගලික අංශයේ දිගුකාලීන ආයෝජන ද දායක විය.

**1.5 රූප සටහන** **ගෙවුම් තුලනය**




**2010 වසරේ දී රටෙහි විදේශීය සංචිත මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම කරා ළඟා විය.** 2009 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් මිලියන 5,097 ක් ව පැවති දළ නිල සංචිත (ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් හැර), 2010 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් මිලියන 6,610 ක (ආනයනික මාස 5.9 ක) වාර්තාගත ඉහළ මට්ටමක් දක්වා වර්ධනය විය. ව්‍යාපෘති මූල්‍යයනය සඳහා ණය වැඩි වශයෙන් ලැබීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම අඛණ්ඩව ක්‍රියාත්මක වීම, තෙවන ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය අවශෝෂණය කරගැනීම් ආදිය විදේශීය සංචිත වර්ධනය වීමට දායක විය. මේ අතර, ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් රහිත මුළු විදේශීය සංචිත 2009 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6,770 ක සිට 2010 අවසානයේ දී එ.ජ.ඩොලර් මිලියන 8,035 ක් (ආනයනික මාස 7.1 ක්) දක්වා සියයට 19 කින් වර්ධනය විය.


**රටෙහි සමස්ත විදේශීය ණය ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2010 වසරේ දී සියයට 43.3 ක මධ්‍යස්ථ අගයක් වාර්තා කළේය.** යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීමට ලබාගත් ස්වෛරීත්ව බැඳුම්කරවලින් ලැබීම් ඇතුළු රජය වෙත ලැබුණු විදේශීය මුදල් ප්‍රවාහ සහ මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ වූ ලැබීම්, නොපියවූ විදේශීය ණය වර්ධනයට ඉවහල් විය. මුළු මැදි හා දිගුකාලීන විදේශ ණය වලින් සියයට 85.9 ක් රජයේ නොපියවූ ණය වන අතර, ඉතිරිය පෞද්ගලික අංශය හා රාජ්‍ය සංස්ථා ලබාගත් ණය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත වූ ණය වගකීමය. ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් ඇතුලත් සමස්ථ ණය සේවාකරණ ගෙවීම් භාණ්ඩ හා සේවා අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස 2009 වසරේ දී සියයට 19.0 ක් වූ අතර, එය 2010 වසරේ දී සියයට 15.2 ක් දක්වා අඩු විය.

**2010 වසරේ දී විනිමය අනුපාත ප්‍රතිපත්තිය මූලික වශයෙන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ස්ථායීතාවය පවත්වාගෙන යාම කෙරෙහි යොමු විය.** දේශීය වෙළෙඳපොළට විදේශ විනිමය අඛණ්ඩව ලැබීම හමුවේ විනිමය අනුපාතයේ සිදුවිය හැකි අධික උච්චාවචනයන් අවම කිරීමට සහ තවදුරටත් විදේශ සංචිත ශක්තිමත් කිරීමට මහ බැංකුව විසින් විදේශ විනිමය අවශෝෂණය කර ගන්නා ලදී. කෙසේ වුවත්, ඛනිජ තෙල් ආනයන බිල්පත් පියවීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය ගෙවීම් සිදුවූ බැවින් වෙළෙඳපොළ ද්‍රවශීලතාව ප්‍රමාණවත් මට්ටමක පවත්වාගෙනයාම සඳහා 2010 අවසාන කාර්තුවේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට විදේශ විනිමය සපයන ලදී.


### රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්

**2010 වසරේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ සිදුවූ සැලකිය යුතු වර්ධනය, පෙර වසරේ දී සියයට 9.9 ක පැවති සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.9 ක මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය.** වසරේ පළමු මාස හත සඳහා, රාජ්‍ය මූල්‍ය කටයුතු අතුරු සම්මත ගිණුම් රාමුවක් යටතේ සහ ඉන්පසු ජනාධිපතිතුමාගේ නියමය පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වගන්තියේ තුන්වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක විය. 2010 වසර සඳහා වූ අයවැය පාර්ලිමේන්තුව මගින් අනුමත කරනු ලැබුවේ 2010 ජූලි මාසයේදී ය. 2010 වසර සඳහා වූ අයවැය ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම සහ නව ආදායම් සහ වියදම් ක්‍රියාමාර්ග සඳහා පැවති ඉඩකඩ අඩු තත්ත්වයක් යටතේ වුවද, සමස්ත අයවැය හිඟය මුලින් අපේක්ෂා කළ සියයට 8 ක ඉලක්කය තුළ පවත්වා ගත හැකි විය.

**1.6 රූප සටහන** **රාජ්‍ය ආදායම, වියදම සහ සමස්ත අයවැය හිඟය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**



**1.7 රූප සටහන** **රාජ්‍ය ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




**දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ඉහළයාම සහ ආනයන ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම හේතුකොටගෙන රජයේ ආදායම 2010 වසරේ මුලින් අපේක්ෂා කල ඉලක්කය ඉක්මවා ඉහළ ගියේය.** රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ වූ සියයට 14.5 ක සිට 2010 දී සියයට 14.6 ක් දක්වා වැඩි විය. තීරු බදු ව්‍යුහය කාණ්ඩ 4 කට තාර්කීකරණය කිරීම සහ ආනයන තීරු බදු අධිභාරය ඉවත් කිරීම මෙන්ම මෝටර් රථ ඇතුළුව ආනයන භාණ්ඩ ගණනාවක් සඳහා බලපැවැත්වූ බදු අඩුකිරීම ආනයන ඉල්ලුමේ ඉහළයාමට හේතු වූ අතර, එය ආනයන සම්බන්ධිත බදුවලින් ලැබෙන ආදායම වැඩිවීමට හේතු විය. කෙසේ වුවද, ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළයාමෙන් දේශීය වෙළෙඳපොළට ඇතිවන බලපෑම අඩු කිරීමට රජය විසින් පෙට්‍රල් සහ ඩීසල් ඇතුළු මූලික භාණ්ඩ වර්ග කිහිපයක බදු සංශෝධනය කරන ලදී. මීට අමතරව, ගෝලීය ආර්ථික හා මූල්‍ය අර්බුදයෙහි බලපෑමට ලක් වූ කර්මාන්ත සහ තෝරාගත් කර්මාන්ත කිහිපයකට සහාය වීම සඳහා විවිධ බදු සහන ලබා දෙන ලදී.


**පුනරාවර්තන වියදම් දැඩි ලෙස අධීක්ෂණය කිරීම සහ සැලසුම්ගත යටිතල පහසුකම් ව්‍යාපෘති වේගවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් සිදුකිරීම සමග රජයේ වියදම් 2010 වසර සඳහා වූ මූලික අයවැය ඉලක්කය තුළ පවත්වාගෙන යාමට හැකි විය.** මුළු වියදම සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2009 වසරේ දී සියයට 24.9 සිට 2010 දී සියයට 22.9 දක්වා අඩු විය. මුළු වියදම සහ ශුද්ධ ණය දීම ප්‍රතිශත අංක 2.0 කින් අඩු වීම, පුනරාවර්තන වියදම් ප්‍රතිශත අංක 1.5 කින් සහ ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් ප්‍රතිශත අංක 0.5 කින් අඩු වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. පුනරාවර්තන වියදම් තාර්කීකරණය කිරීමට දරන ලද ප්‍රයත්නයන් තුළින් රජයේ වියදම මූලික අයවැය ප්‍රතිපාදන තුළ පවත්වාගැනීමට හැකි වූ අතර, රාජ්‍ය ආයෝජන වැඩසටහන බාධාවකින් තොරව පවත්වාගෙන යන ලදී.

**දේශීය වෙළෙඳපොළ මත සහ පොලී අනුපාතික මත පීඩනය අඩු කරමින් අයවැය හිඟය පියවාගැනීම සඳහා රජය විදේශ මූලාශ්‍ර මත වැඩි වශයෙන් රඳා පැවතුණි.** ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යාම සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළෙහි පැවැති වාසිදායක ණය ගැනීමේ කොන්දේසි හේතුකොටගෙන දස වසරක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් නිකුත් කිරීමට රජයට හැකි විය. බැඳුම්කරයේ වටිනාකම මෙන් හය ගුණයක ඉල්ලුම්පත් ආකර්ෂණය කරගනිමින් සියයට 6.25 ක අඩු පොලී අනුපාතිකයක් යටතේ එම බැඳුම්කරය නිකුත් කරන ලදී. එමෙන්ම අඩු පොළී අනුපාතික සහ දිගු පරිණත කාලයන් සහිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමටද රජයට හැකිවිය. අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යයනය කිරීමේ දී, රජය බැංකු මූල්‍යයන මත රඳා පැවතීම අඩු කළ අතර, එමගින් පෞද්ගලික අංශයට සම්පත් මුදාහැරීමටත් දේශීය පොලී අනුපාතික මත පීඩනය අඩු කිරීමටත් හැකි විය. 2010 වසරේ මුළු ශුද්ධ දේශීය මූල්‍යයනය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.6 ක් හා ශුද්ධ විදේශ මූල්‍යයනය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.4 ක් වූ අතර, විදේශ මූල්‍යයනය, විදේශ ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.5) සහ රජයේ සුරැකුම්පත්වල විදේශ ආයෝජන (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.9) කින් සමන්විත විය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම අඩු අයවැය හිඟය සහ නාමික ද.දේ.නි.යෙහි ඉහළ වර්ධනය හේතුකොටගෙන සමුච්චිත රාජ්‍ය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2009 දී සියයට 86.2 සිට 2010 දී සියයට 81.9 දක්වා අඩු විය.

### මුදල් අංශයේ වර්ධනයන්

**ආර්ථික කටයුතුවලට සහයවීම සඳහා ණය වර්ධනය ඉහළ නැංවීමේ අරමුණින් 2010 වසරේ දෙවන භාගයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පහත දමමින් මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තව දුරටත් ලිහිල් කරන ලදී.** 2010 පළමු කාර්තු තුන තුළ පුළුල් මුදල්හි වර්ධනය අඛණ්ඩව පහත යාම මගින් ඉල්ලුම් පීඩනයන් අඩු මට්ටමක පැවතීම පිළිබිඹු කළ අතර, දේශීය පාරිභෝගික මිල සඳහා පැවැති වඩාත් හිතකර වූ පෙරදැක්ම හේතුවෙන් මහ බැංකුවට වසර තුළ දී තවදුරටත් සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යාමට හැකි විය. ජූලි මාසයේ දී ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පදනම්

**1.8 රූප සටහන** **මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික**




අංක 25 බැගින් අඩු කිරීමත්, අගෝස්තු මාසයේ දී ප්‍රතිවිකුණුම් අනුපාතිකය තව දුරටත් පදනම් අංක 50 කින් අඩු කිරීමත් සමග ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පරතරය අඩු වූ අතර, 2010 අග වන විට ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.25 ක් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.00 ක් වශයෙන් පැවතුණි. පොලී අනුපාතික කොරිඩෝවේ පරතරය තවදුරටත් අඩු කරමින් 2011 ජනවාරි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කරන ලද අතර, වර්තමානයේ එම පරතරය ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය වන සියයට 7.00 සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය වන සියයට 8.50 අතර පවතී.

**2009 මැදභාගයේ පමණ සිට දේශීය මුදල් වෙළෙඳපොළ රුපියල් ද්‍රවශීලතාවය අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයක් බවට පත්වූ අතර, 2010 වසර තුළදී ද තවදුරටත් එම තත්ත්වය දක්නට ලැබුණි.** රුපියල විශාල ලෙස අධිප්‍රමාණයවීම වැළැක්වීම සඳහා මෙරටට ලැබුණ විදේශ විනිමය මහ බැංකුව විසින් අවශෝෂණය කිරීම මෙලෙස අතිරික්ත ද්‍රවශීලතාව ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර ආයෝජකයන් වෙත ඔක්තෝබර් මාසයේ දී ස්වෛරීත්ව බැඳුම්කරයක් නිකුත් කිරීම, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සඳහා ලැබුණ ශුද්ධ විදේශීය ආයෝජන සහ රජය හා පෞද්ගලික අංශය වෙත ලැබුණ අනෙකුත් විදේශ අරමුදල් හේතුවෙන් වසරෙහි මුල් කාර්තු තුන තුළ දී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මෙලෙස විදේශ විනිමය අතිරික්තයක් ඇති විය.


**මහ බැංකුව ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකළ අතර, එමගින් පොලී අනුපාතික ස්ථායීව පවත්වා ගනිමින් සංචිත මුදල් ඉලක්කගත මට්ටමේ පවත්වාගැනීමට හැකි විය.** මහ බැංකුව වෙතැති රජයේ සුරැකුම්පත් ප්‍රමාණය පහත වැටීමත් සමග එක්දින සහ කාලීන පදනම මත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා මහ බැංකුව විසින් සිය සුරැකුම්පත් නිකුත් කරන ලදී. 2009 වසරේ සිට විවට වෙළෙඳ කටයුතු සඳහා යොදාගන්නා ලද විදේශ විනිමය හුවමාරු ගිවිසුම් ද (SWAP Agreements) ද්‍රවශීලතාවයෙන් කොටසක් අවශෝෂණය කර ගැනීම සඳහා යොදා ගන්නා ලදී. 2010 ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව විසින් බැඳුම්කර ණයට ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ අතර, වසරේ අවසාන භාගයේ සිට වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීමට විවට වෙළෙඳ කටයුතු සඳහා මෙලෙස ණයට ගත් බැඳුම්කර භාවිතා කරන ලදී. මේ අතර, ඉහළ අතිරික්ත ද්‍රවශීලතාවයක් ඇති බැංකු අතර, ඒවායේ ආයෝජන කළඹ කළමනාකරණය සඳහා කෙටිකාලීන රජයේ සුරැකුම්පත් ලබාගැනීමට ඇති වූ අධි තරගකාරී තත්ත්වය හේතුවෙන් මාස තුනක කල් පිරීමේ කාලයක් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතික මහ බැංකුවෙහි ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකයට වඩා පහත බැසීමත් සමග විවට වෙළෙඳ කටයුතු යටතේ සිදු කරනු ලබන එක්දින හා කාලීන වෙන්දේසි 2010 ඔක්තෝබර් මස 20 වැනි දින සිට අත්හිටුවන ලදී. මේ අනුව, වෙළෙඳපොළ සහභාගිවන්නන් තවදුරටත් සිය අතිරික්ත ද්‍රවශීලතාව මහ බැංකුවෙහි නිත්‍ය පහසුකම යටතේ තැන්පත් කරන ලදී. 2009 අග පැවති රුපියල් බිලියන 159.6 ක් වූ මුදල් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව 2010 අග වන විට රුපියල් බිලියන 124.3 ක් විය.

**පුරෝකථනය කරන ලද ප්‍රධාන සාර්ව ආර්ථික වර්ධනයන් සැලකිල්ලට ගනිමින් සකස් කරනු ලබන මුදල් වැඩසටහනට අනුකූල වන පරිදි මහ බැංකුවෙහි මුදල් මෙහෙයුම් තවදුරටත් මුදල් සමස්තයන් ඉලක්ක කිරීමේ රාමුවක් යටතේ සිදු විය.** මේ අනුව මුදල් ප්‍රතිපත්තියෙහි අතරමැදි ඉලක්කය ලෙස පුළුල් මුදල් සැපයුම තවදුරටත් පවත්වාගෙන ගිය අතර, පුළුල් මුදල් සැපයුම සමග ගුණකයකින් සම්බන්ධ වූ සංචිත මුදල් සැපයුම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස තව දුරටත් පැවතුණි. මහ බැංකුවෙහි මුදල් වැඩසටහන මූලිකව සකස් කිරීමේ දී පුළුල් මුදල් සහ සංචිත මුදල් යන දෙකෙහිම වාර්ෂික සාමාන්‍ය වර්ධන ඉලක්කයන් සියයට 14.5 ක් ලෙස තීරණය කරන ලදී. කෙසේ වුවද, මූලිකව පුරෝකථනය කරන ලද මට්ටම ඉක්මවූ වේගයකින් දේශීය ආර්ථිකය ප්‍රසාරණය වන බව වසර මැද පමණ වන විට පෙනී ගිය බැවින් සහ 2010 ජූනි මාසයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ජාතික අයවැයෙහි තොරතුරු ද ඇතුළත්

කළයුතු බැවින්, පසුව මුදල් වැඩසටහන සංශෝධනය කිරීම අවශ්‍ය විය. මේ අනුව 2010 වසර සඳහා පුළුල් මුදල්හි ඉලක්කගත වර්ධනය ජූලි මාසයේ දී සියයට 15 දක්වා ඉහළ නංවන ලදී. මේ අතර, විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීමත් සමග මුදල් සැපයුමෙහි අන්තර්ගත "මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්" සංඝටකය සැලකිය යුතු ලෙස ඉහළයාම හේතුවෙන් ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතය ඉහළ ගිය අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස මුදල් ගුණකයෙහි අඩුවීමක් සිදු විය. මෙම වර්ධනයන් සැලකිල්ලට ගනිමින් පුළුල් මුදල්හි සංශෝධනයට අනුකූල වන පරිදි 2010 ජූලි මාසයේ දී සංචිත මුදල්හි ඉලක්කගත වාර්ෂික සාමාන්‍ය වර්ධනය ද සියයට 21.2 ක් දක්වා ඉහළ දමන ලදී.

**2010 වසරේ දී දෛනික සාමාන්‍ය සංචිත මුදල්හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2010 මුදල් වැඩසටහනෙහි පැවති ඉලක්කගත මට්ටමට අනුකූලව පැවතුණි.** සංචිත මුදල්හි ප්‍රභවයන් සලකා බලන විට 2010 තුළ සංචිත මුදල් ඉහළයාමට මහ බැංකුවෙහි ශුද්ධ විදේශ වත්කම් ඉහළයාම මුළුමනින්ම හේතු විය. රජය විසින් අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ ස්වෛරීත්ව බැඳුම්කරයක් නිකුත් කිරීමෙන් රැස්කරන ලද අරමුදල්වලින් කොටසක් (එ.ජ.ඩොලර් මිලියන 492 ක්) යොදා ගනිමින් මහ බැංකුව වෙතැති රුපියල් බිලියන 55 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර මුදල් ගෙවා පියවීමත්, වාණිජ බැංකු වෙතැති තම වගකීම්වලින් කොටසක් ගෙවා නිම කිරීම සඳහා මෙලෙස රැස්කරන ලද අරමුදල්වලින් තව දුරටත් එ.ජ.ඩොලර් මිලියන 386 ක් මහ බැංකුවට විකිණීමත් මෙලෙස ශුද්ධ විදේශ වත්කම් ඉහළයාමට හේතු විය. මේ අතර, මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් ප්‍රමාණය අඩු විය.

**1.9 රූප සටහන**
**මුදල්, ණය සහ පොලී අනුපාතික**




**2010 දී පුළුල් මුදල්හි වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 15.3 ක් වූ අතර, එය ඉලක්කගත සියයට 15 ක මට්ටමට අනුකූලව පැවතුණි.** භාවිතීය අංශයෙන් සලකා බලන විට මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් මෙන්ම විශේෂයෙන්ම ඉල්ලුම් තැන්පතු ඇතුළු මහජනයා වෙතැති තැන්පතු යන දෙකෙහිම ඉහළයාම තුළින් පුළුල් මුදල්හි වර්ධනය පිළිබිඹු විය. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු පොලී උපයනු ලබන තැන්පතු, එනම් ඉතුරුම් හා කාලීන තැන්පතු (ආසන්න මුදල්), 2009 වසරේ පැවති සියයට 18.0 ක් වූ වර්ධනයට සාපේක්ෂව 2010 දී සියයට 14.6 ක් වූ තරමක අඩු වේගයකින් වර්ධනය විය.

**වසර තුළ දී ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ අතර, පුළුල් මුදල්හි වැඩිවීම, බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් වැඩිවීමේ ප්‍රතිඵලයක් විය.** ශුද්ධ දේශීය වත්කම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ පෞද්ගලික අංශය විසින් වාණිජ බැංකුවලින් ලබාගත් ණය විශාල ලෙස ඉහළයාමයි. එම ණයෙහි 2009 වසර තුළ දී වූ සියයට 5.8 ක සෘණ වර්ධනය සමග සැසඳීමේ දී 2010 වසර තුළ දී ශක්තිමත් ලෙස යථාතත්ත්වයට පත්වෙමින් වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 25.1 ක් ලෙස වාර්තා විය. ණය පොලී අනුපාතික අඩුවීම, අභ්‍යන්තර ගැටුම් අවසන්වීමත් සමග ආර්ථික තත්ත්වය වැඩිදියුණු වීම, ව්‍යාපාරික විශ්වාසය වර්ධනය වීම සහ ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථාතත්ත්වයට පත්වීම යනාදිය පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළයාමට උපකාරී විය. රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය පිළිබඳව සලකන විට විශේෂයෙන්ම, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ ගිය අතර, එය 2010 වසර තුළ දී මුදල් සැපයුමෙහි වර්ධනයට හේතු විය. කෙසේ වුවද, වසර තුළ දී බැංකු ක්‍රමය මගින් රජයට ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය අඩු විය. මේ අතර, ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු විසින් එතෙර කරන ලද ආයෝජන අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් අඩුවිය. වසර තුළ දී ඔවුන් විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සිදුකළ ආයෝජන ඉහළ යාම සහ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එහි තෙල් ආනයන බිල්පත් ගෙවීම සඳහා විදේශ විනිමය සැපයීම මෙම අඩුවීමට බොහෝ දුරට හේතු විය.

**මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩුවීමට ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ පොලී අනුපාතික 2010 වසරේ දී තවදුරටත් පහත වැටුණු අතර, එමගින් ආර්ථික කටයුතු වර්ධනයවීමට අමතර ශක්තියක් සැපයීය.** වසර තුළ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතිකය,

මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයට සඵල දායකත්වයක් සපයමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව මධ්‍යයේ තවදුරටත් පැවතුණි. තවද, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද වසර තුළ දී පහත වැටුණි. මේ අතර, 2010 වසරේ දී රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළෙඳපොළෙහි ඵලදා වක්‍රය පහළට විතැන්වෙමින් දිගුකාලීන පරිණත කාලයක් දක්වා දීර්ඝ විය. මෙම පොලී අනුපාතික ව්‍යුහය පහළට විතැන්වීම සඳහා මුදල් වෙළෙඳපොළ තුළ දිගින් දිගටම පැවති අතිරික්ත ද්‍රවශීලතාව මෙන්ම ඉදිරි උද්ධමනය පිළිබඳව පැවති යහපත් අපේක්ෂාවන් ද බලපාන ලදී. මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින් 2010 වසර තුළ දී වාණිජ බැංකු විසින් තම ඉතුරුම් සහ ණය ලබාදීමේ අනුපාතික ක්‍රමයෙන් අඩු කරන ලදී. මහ බැංකුව එහි ප්‍රතිපත්ති පොලී අනුපාතික 2011 ජනවාරි මස දී තවදුරටත් අඩුකිරීම නිසා පොලී අනුපාතික අඩුවීමේ ප්‍රවණතාවය 2011 වසර තුළ දී ද පෙන්නුම් කරයි.

## මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව

**2010 වසරේ දී මූල්‍ය පද්ධතියේ සමස්ත ක්‍රියාකාරිත්වය වර්ධනය වෙමින් රටෙහි මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තවදුරටත් ශක්තිමත් විය.** පරීක්ෂණ සහ ගැටලු විසඳීම තුළින් අඛණ්ඩව සුපරීක්ෂණ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අමතරව, විවිධ නියාමන ක්‍රියාමාර්ග හඳුන්වාදීම සිදුකළ අතර, එමගින් මූල්‍ය අංශයේ ස්ථායීතාවය තවදුරටත් ශක්තිමත් කිරීමටත් මහජන විශ්වාසය වර්ධනය කිරීමටත් හැකිවිය. මහජනතාවගේ සහ ආයෝජකයන්ගේ විශ්වාසයට මෙන්ම ව්‍යාපාරික මෙහෙයුම්වලට අහිතකර ලෙස බලපෑම් ඇති කරමින් 2008 සහ 2009 වසරවල දී පැනනැගුණු දේශීය සහ බාහිර කම්පනයන්ගේ බලපෑම මධ්‍යයේ වුවද, මූල්‍ය පද්ධතියේ වැඩිදියුණු වූ කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර එය මූල්‍ය ආයතනවල, වෙළෙඳපොළවල්වල, පියවීම් පද්ධතිවල හා මූල්‍ය ආරක්ෂණ ක්‍රියාමාර්ගවල කාර්යසාධනය පෙන්නුම් කරන ප්‍රධාන නිර්ණායක මගින් පිළිබිඹු විය.

**වර්ධනය වෙමින් පවතින ආර්ථිකයට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය ගනුදෙනුවල පැවති ඉහළ යාම පිළිබිඹු කරමින් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන 2010 වසරේ දී ඉහළ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** මූල්‍ය අංශය තුළ වඩාත් ප්‍රමුඛ සහ පද්ධතිමය වශයෙන් වැදගත්වන බැංකු අංශය, සැලකිය යුතු ඉහළ ලාභදායීතාවයක් පවත්වා ගනිමින් ඉහළ ව්‍යාපාර වර්ධන අනුපාතයක් පෙන්නුම් කළේය. ඔවුන්ගේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත සහ ද්‍රවශීල අනුපාත ව්‍යවස්ථාපිත මට්ටමට වඩා සැලකිය යුතු ලෙස ඉහළින් පැවතුණි. බැංකු නොවන මූල්‍ය ආයතන පිළිබඳව සැලකීමේ දී, 2009 වසර තුළ ද්‍රවශීලතා ගැටලුවලට මුහුණදුන් පසු ලියාපදිංචි මූල්‍ය සමාගම් අංශය 2010 වසර තුළ ක්‍රමයෙන් යථාතත්ත්වයට පත්විය. මහ බැංකුව නිසි කාලීනව අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම නිසා ලියාපදිංචි මූල්‍ය සමාගම් පිළිබඳව තැන්පතුකරුවන්ගේ විශ්වාසය යළි ප්‍රතිෂ්ඨාපනය වී ඇත. විශේෂිත ලීසිං සමාගම් ණයවල ගුණාත්මකභාවය ඉහළ යාම සහ බොල් සහ අඩමාණ ණය මත නිසිපරිදි වෙන්කිරීම් සිදුකිරීම සමග 2010 වසර තුළ ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව වර්ධනය විය. රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළෙඳුන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන ප්‍රධාන මූල්‍ය දර්ශක 2010 තුළ වර්ධනය වූ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර අවදානම් කළමනාකරණ දර්ශක විචක්ෂණශීලී මට්ටමේ පැවතුණි. රක්ෂණ අංශය ද 2010 තුළ ඉහළ ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය.

**මූල්‍ය ආයතනයන්ගේ ශාඛා ජාලයෙහි වර්ධනය වීම 2010 වසර තුළ අඛණ්ඩව සිදුවිය.** බැංකු ශාඛා ජාලය ශාඛා 85 ක්, ව්‍යාප්ති කාර්යාල 97 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 130 ක් විවෘත කිරීමත් සමග තවදුරටත් පුළුල් විය. නව බැංකු ප්‍රමාණයෙන් උතුරු සහ නැගෙනහිර පළාත් තුළ වූ බැංකු ඒකක 48 ද ඇතුළත්ව ශාඛා 67 ක් සහ ව්‍යාප්ති කාර්යාල 77 ක් බස්නාහිර පළාතෙන් බැහැරව පැවතුණි. නව බලපත්‍ර දෙකක් නිකුත් කිරීමත් සමග, ලියාපදිංචි මූල්‍ය සමාගම් මුළු ප්‍රමාණය 37 ක් දක්වා වර්ධනය වූ අතර, වසර තුළ දී ශාඛා ජාලය 98 කින් වර්ධනය විය. විශේෂිත ලීසිං සමාගම්හි ශාඛා ජාලය, උතුරු සහ නැගෙනහිර පළාත් තුළ ශාඛා 15 ක් ඇතුළුව ශාඛා 44 ක් ආරම්භ කිරීමත් සමග තවදුරටත් පුළුල් විය.

**බැංකුවල අවදානම් කළමනාකරණ රාමුව සහ ආරක්ෂණ ජාලය වර්ධනය කිරීම සඳහා මහ බැංකුව එහි අධීක්ෂණ සහ නියාමන ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කළේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා 2010 සිට 2015 වසර තෙක් වාර්ෂික පදනම මත කොටස් වශයෙන් අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වර්ධනය කිරීම, ව්‍යවස්ථාපිත තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ණය අක්‍රීය ණය ලෙස වර්ගීකරණය ලිහිල් කිරීම, අක්‍රීය ණය මත වූ සාමාන්‍ය වෙන්කිරීම් ප්‍රමාණය අඩු කිරීම, විධායක මට්ටමේ නිලධාරීන්ගේ සුදුසු සහ යෝග්‍ය බව තහවුරු කිරීමේ ක්‍රමවේදයන් යොදාගැනීම, ලැයිස්තුගත නොකළ දේශීය වශයෙන් සංස්ථාපිත පෞද්ගලික බැංකු 2011 දෙසැම්බර් 31 වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගතවීමේ අවශ්‍යතාවය නියම කිරීම සහ බාහිර පාර්ශ්වයන්ගෙන් සේවා ලබාගැනීමේ කටයුතුවල

දී ඒ සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම, මෙම ක්‍රියාමාර්ගයන්ට අයත් වේ. තැන්පතු ලබාගැනීමේ දී අනවශ්‍ය තරගයක් ඇතිවීම වැලැක්වීමට සහ මහජන විශ්වාසය සහ ස්ථායීතාවය සහතික කිරීම පිණිස ලියාපදිංචි මූල්‍ය සමාගම් මගින් ලබාදෙන පොලිය සඳහා උපරිම අනුපාතිකයක් නියම කරමින් නියාමනයන් නිකුත් කරන ලදී. වර්තමාන මූල්‍ය ව්‍යාපාර පනත වෙනුවට 2011 වසරේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත නව ව්‍යාපාර මූල්‍ය පනත කෙටුම්පත් කිරීම සිදුකළ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණි. විශේෂිත ලීසිං සමාගම් සම්බන්ධයෙන් සලකන විට ඔවුන්ගේ අනාගත වර්ධනයට විචක්ෂණශීලීව පහසුකම් සැලසීම සඳහා පොදු සමාගමක් ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පියවර කිහිපයකින් වැඩි කරන ලදී.

**වසර තුළ දී, ද්‍රවශීලතා අර්බුදයට ලක්වූ ලියාපදිංචි මූල්‍ය සමාගම් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.** කළමනාකරණ නියෝජිතයකු පත්කිරීම, නව ආයෝජකයින් විසින් ප්‍රාග්ධනය සැපයීම සහ කළමනාකරණය පවරාගැනීම, තැන්පතු වගකීම් සහ ණය කොටස්වලට පරිවර්තනය කිරීම, තැන්පතු සහ පොලී යළි උපලේඛනගත කිරීම, මූර්ත දේපළ විකිණීම සහ අක්‍රීය වත්කම් ඉක්මණින් යථා තත්ත්වයට පත්කර ගැනීම මෙම ක්‍රියාමාර්ගවලට අතුළත් වේ. මෙයට අමතරව බලපත්‍රලාභී බැංකු මගින් ලියාපදිංචි මූල්‍ය සමාගම් වෙත ණය ලබාදීම පහසු කිරීම පිණිස මහ බැංකුව විසින් ඇප සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ලියාපදිංචි මූල්‍ය සමාගම් 3 ක් සාමාන්‍යය ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට සමත් වූ අතර, ලියාපදිංචි මූල්‍ය සමාගම් දෙකක කළමනාකරණ නියෝජිතයන් ඉවත් කරන ලදී. ලියාපදිංචි මූල්‍ය සමාගම් දෙකක් සඳහා උපායශීලී ආයෝජකයන් හඳුනාගත් අතර, අනෙකුත් ලියාපදිංචි මූල්‍ය සමාගම් සඳහා වූ අනාගත ආයෝජකයින් විමර්ශන සහ නිසි ඇගයීමේ ක්‍රියාවලියකට භාජනය වී ඇත. පීඩා විඳි සියලුම ලියාපදිංචි මූල්‍ය සමාගම් 2011 වසර තුළ දී ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු මුළුමනින්ම යථාතත්ත්වයට පත්කර ගැනීමට සමත් වනු ඇත. නීති විරෝධී ලෙස මූල්‍ය ව්‍යාපාර කටයුතුවල යෙදුන ආයතන පරීක්ෂා කිරීම අඛණ්ඩව සිදු වූ අතර, තීන්දු ලබා නොදුන් නඩු සම්බන්ධයෙන් උසාවියට සහාය ලබාදෙන ලදී. එයට සමගාමීව, එවැනි ආයතනවල ආයෝජනය කිරීමේ අවදානම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා දිවයින පුරා වැඩසටහන් මෙන්ම වෙළෙඳ දැන්වීම් ආදිය මාර්ගයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණි.

**රක්ෂණ සමාගම් නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.** රක්ෂණ ඔප්පු දරන්නන් ආරක්ෂා කිරීම සඳහා විචක්ෂණශීලී නියාමනය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීමට රක්ෂණ කර්මාන්ත පනතට යෝජිත සංශෝධනයන් 2010 වසර තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. සියලුම රක්ෂණ සමාගම් කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත විය යුතු වේ. 2010 ජුනි මාසයේ දී ලන්ඩන් ජොයින්ට් කාර්ගෝ කමිටුව (London Joint Cargo Committee) මගින් ශ්‍රී ලංකාව සඳහා වූ යුධ අවදානම් ආන්තිකය ඉවත් කිරීම සහ ජාතික රක්ෂණ භාරකාර අරමුදල මගින් ත්‍රස්තවාදය සඳහා වූ ආන්තිකය 2010 අප්‍රේල් මාසයේ දී සියයට 75 කින් අඩු කිරීම නිසා රක්ෂණ ඔප්පු දරන්නන්ට රක්ෂණ පිරිවැය අඩුවනු ඇත.

**ගෙවීම් සහ පියවීම් පද්ධතියේ වර්ධනය 2010 වසර තුළ අඛණ්ඩව සිදු විය.** තත්කාලීන දළ පියවීම් පද්ධතිය යටතේ ආයතනවලට දවස ඇතුළත ලබාදෙන ද්‍රවශීලතා පහසුකම් ලබාදීමේ ක්‍රියාපටිපාටිය, ඔවුන්ගේ ඉල්ලීම මත පමණක් සැපයීමේ තත්ත්වයෙන් වෙනස් කර ඔවුන්ගේ අභිමතය පරිදි සැපයෙන සේ වැඩිදියුණු කරන ලදී. සහභාගිත්ව ආයතනවලට මාර්ගගත සම්බන්ධතාව සැපයීම සඳහා ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය වැඩි දියුණු කරන ලදී. ලංකා ක්ලියර් ආයතනය වෙත චෙක්පත් ලැබීමේ දී ඇතිවන කාල පමාව ඉවත් කිරීමට ඒ සඳහා සහභාගීවන බැංකුවලට ඡායාගත චෙක්පත් ශාඛා මට්ටමින් ලබා ගනිමින් එම ඡායාගත චෙක්පත් ලංකා ක්ලියර් ආයතනය වෙත භාරදීමට උපදෙස් දෙනු ලැබිණි.

**ලෝකයේ විශිෂ්ට කාර්යසාධනයක් සහිත වෙළෙඳපොළවලින් එකක් බවට පත්වෙමින් 2010 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ ඓතිහාසික වශයෙන් ඉහළ මට්ටමකට වර්ධනය වූ අතර, සියලු දර්ශක ඉහළ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** 2010 වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය සියයට 96 කින් සහ මිලංක මිල දර්ශකය සියයට 83 කින් ඉහළ ගිය අතර, සියලු උප අංශයන්ගේ මිල දර්ශක වර්ධනය විය. අලෙවි කරන ලද කොටස් සංඛ්‍යාව සිව් ගුණයකින් වර්ධනය වූ අතර, දෛනික සාමාන්‍ය පිරිවැටුම තුන් ගුණයකට වැඩියෙන් වර්ධනය විය. වෙළෙඳපොළ මිල ඉපැයුම් අනුපාතය තවදුරටත් වර්ධනය වූ අතර, කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2010 වසර අග වන විට රුපියල් ට්‍රිලියන 2.2 ක් දක්වා වර්ධනය විය. වෙළෙඳපොළ කටයුතුවල නිරතවීමට දේශීය ආයෝජකයන්ට වඩාත් පහසුකම් සලසමින්, බොහොමයක් කොටස්වල ඉහළ ගිය මිල ගණන් හමුවේ ප්‍රාග්ධන ලාභ ලබාගැනීමේ අරමුණින් ශුද්ධ විදේශීය විකුණුම් වර්ධනය වූ අතර,

දේශීය ආයෝජකයින් වැඩි ප්‍රමාණයකට වෙළෙඳපොළ ගනුදෙනුවලට සහභාගිවීමට ඒ අනුව හැකි විය. නව කොටස් නිකුත් කිරීමේ කටයුතු ද 2010 වසර තුළ දී ඉහළ ගියේය. 2010 වසර තුළ දී මූලික කොටස් නිකුතුන් දහයක් පැවැති අතර, සියලු නිකුතුන් සඳහා සැලකිය යුතු අධි දායකත්වයක් පැවතුණි. මේ අතර, සමාගම් 31 ක් විසින් හිමිකම් නිකුතුන් සිදු කරන ලදී.

### 1.3 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම[2]

**1930 න් පසුව ගෝලීය ආර්ථිකය මුහුණ දුන් විශාලතම ආර්ථික අවපාතය 2009 දී පැවති අතර, ඉන් ක්‍රමයෙන් යථාතත්ත්වයට පත්වීම 2010 දී සිදුවිය.** පෞද්ගලික ඉල්ලුම වැඩිවීම, වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන් ඉහළ යාම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට හා බාහිර සමතුලිතතාවය යළි ස්ථාපනය කිරීමට ගන්නා ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙසේ ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ඉහළ සේවා වියුක්තිය සහ නැවතත් මූල්‍ය අංශය වෙත එල්ල වූ පීඩාකාරී තත්ත්වය හා පද්ධති අවදානම් තත්ත්වය අවාසිදායක කරුණු ලෙස පැවතුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික දැක්ම (World Economic Outlook) ප්‍රකාශනයට අනුව 2009 වසරේ දී වාර්තා වූ සියයට 0.6 ක පසුබෑමට සාපේක්ෂව 2010 වසරේ දී ගෝලීය ආර්ථිකය සියයට 5.0 කින් වර්ධනයවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2009 වසරේ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව ඇති වූ ආර්ථික අවපාතයේ බලපෑමට විශාල වශයෙන් ලක් නොවූ නැගී එන ආර්ථිකයන් 2010 වසරේ දී ගෝලීය ආර්ථිකය නැවත යථාතත්ත්වයට පත් කිරීමේ නියමුවන් වශයෙන් කටයුතු කරන ලදී. 2009 වසරේ ගෝලීය ආර්ථික පසුබෑමට දරුණු ලෙස ලක් වූ දියුණු ආර්ථිකයන් සියයට 3.0 කින් වර්ධනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. දියුණු රටවල ඉහළ සේවා වියුක්තියක් පැවතීම හේතුවෙන් දේශීය පෞද්ගලික අංශයේ ඉල්ලුම දුර්වල වීම මෙසේ මධ්‍යස්ථ වර්ධනයක් අත්කර ගැනීමට හේතු වී ඇත. ජපාන ආර්ථිකය 2009 වසරේ දී වාර්තා කළ සියයට 6.3 ක සෘණ වර්ධනයට සාපේක්ෂව, 2010 වසරේ දී සියයට 4.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. යුරෝපීය කලාපයේ ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමට, කලාපීය රාජ්‍ය මූල්‍ය අංශයේ අස්ථායීතාවය සහ මූල්‍ය පද්ධතියේ අවදානම්කාරී තත්ත්වයන් අහිතකර ලෙස බලපාන ලද අතර, 2010 දී එම කලාපයෙහි සියයට 1.8 ක් පමණ වූ මධ්‍යස්ථ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ගෝලීය ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වීම හේතුවෙන්, 2010 වසරේ දී නැගී එන සහ සංවර්ධනය වෙමින් පැවති ආර්ථිකයන් සියයට 7.1 කින් ද ආසියානු කලාපයේ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සියයට 9.3 කින් ද වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ගෝලීය ඉල්ලුම ක්‍රමයෙන් යථාතත්ත්වයට පත් වීමත් සමඟ වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන් ද විශේෂයෙන් 2010 වසරේ අග භාගය වනවිට ඉහළ ගියේය.** දියුණු ආර්ථිකයන්හි උද්ධමනය 2009 වසරේ වාර්තා වූ සියයට 0.1 ක සිට 2010 වසර තුළ දී සියයට 1.5 ක් දක්වා වර්ධනය වූ අතර, නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය 2009 දී වාර්තා වූ සියයට 5.2 සිට 2010 දී සියයට 6.3 ක් දක්වා වර්ධනය විය. ගෝලීය ඉල්ලුම ඉහළ යමින් පැවතියදීත් සැපයුම් අංශයේ අහිතකර බලපෑම් හේතුවෙන් වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන් තවදුරටත් ඉහළ යාම සිදුවිය. ආහාර ද්‍රව්‍ය නිපදවන ප්‍රධාන රටවල් කිහිපයක පැවති අහිතකර කාලගුණික බලපෑම් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාමට හේතු වූ අතර, 2010 වසරේ අවසාන භාගයෙහි ඇති වූ භූ-දේශපාලනික අස්ථාවරත්වය තෙල් මිල ඉහළ යාමට බලපාන ලදී. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ආහාර මිල දර්ශකයෙහි අගය 2009 වසරේ දී වාර්තා වූ 177.9 ට සාපේක්ෂව 2010 වසරේ දී 222.6 ක් දක්වා සියයට 25.1 කින් වර්ධනය විය. මේ අතර, සාමාන්‍ය බොර තෙල් (බ්‍රෙන්ට්) බැරලයක මිල 2009 දී වාර්තා වූ එ.ජ.ඩොලර් 61.83 සිට 2010 දී එ.ජ.ඩොලර් 79.97 ක් දක්වා වැඩි විය.

**බොහොමයක් දියුණු හා නැගී එන ආර්ථිකයන් අනුගමනය කළ ලිහිල් මුදල් ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස 2010 වසරේ දී කෙටිකාලීන පොලී අනුපාතික තවදුරටත් අඩු මට්ටමක පැවතුණි.** පසුගිය වසරේ ප්‍රධාන රටවල මහ බැංකු මගින් පොලී අනුපාතික විශාල ලෙස අඩු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ දියුණු ආර්ථිකයන්හි පොලී අනුපාතික ශුන්‍යයට ආසන්න අගයක පැවතිණි. එසේ වුවද, 2010 වසරේ අග භාගය තුළදී රටවල් කිහිපයක් විසින් ඉහළ යන උද්ධමන තත්ත්වයන් සමඟ ඉහළ යන භාණ්ඩ මිල ගණන් පාලනය කිරීමට පොලී අනුපාතික ඉහළ දැමීමට කටයුතු කරන ලදී. 2009 වසරේ ගෝලීය ආර්ථික අර්බුදයෙන් තවදුරටත් යථාතත්ත්වයට පත්වෙමින් පවතින එක්සත් ජනපදය වැනි දියුණු ආර්ථිකයන් කිහිපයක සහ ඇතැම් නැගී එන ආර්ථිකයන්හි පොලී අනුපාතික ඉතා අඩු මට්ටමක පවතින බැවින්, තවදුරටත් පොලී අනුපාතික අඩු කිරීමට හැකියාවක් නොමැති නිසා මූල්‍ය තත්ත්වයන් තවදුරටත් ලිහිල් කිරීම සඳහා එම රටවල් 2010 වසර

[2] මෙම කොටසෙහි දක්වා ඇති විශ්ලේෂණය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික දැක්ම ප්‍රකාශනයේ 2010 ඔක්තෝබර් සහ 2011 ජනවාරි (යාවත්කාලීන) කලාප සහ ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රකාශන මත පදනම් වේ.

තුළදී සම්ප්‍රදායික නොවන ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වී ඇත. මේ තුළ ඉල්ලුම වැඩි කිරීම සඳහා ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් සහ ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිද මූල්‍ය වෙළෙඳපොළවල්හි අවිනිශ්චිතභාවය අඩු කිරීම හා මූල්‍ය පද්ධති අවදානම අඩු කිරීම යන උත්තේජක ද මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය.[3]

**බොහෝ ආර්ථිකයන්හි විනිමය වෙළෙඳපොළවල ඉහළ උච්ඡාවචනයක් දක්නට ලැබිණි.** දේශීය ව්‍යවහාර මුදල් වේගයෙන් අධි ප්‍රමාණය වීම අඩුකර ගැනීමට ලොව වටා රටවල මහ බැංකු විසින් අඩු වැඩි වශයෙන් විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මැදිහත් වන ලදී. ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් ඇති වූ ඉහළ ව්‍යවහාර මුදල් උච්ඡාවචනය හේතුවෙන් 2010 වසරේ මුල් භාගය තුළ දී මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර විය. 2010 වසරේ පළමු භාගය තුළ දී, යුරෝපීය කලාපයෙහි උද්ගත වූ රාජ්‍ය ණය අර්බුදය හේතුවෙන් බ්‍රිතාන්‍ය පවුම සහ යූරෝ සැළකිය යුතු ලෙස අවප්‍රමාණය විය. කෙසේ නමුත්, 2010 වසරේ අග භාගය තුළ දී, චීනය සිය විදේශීය සංචිත විවිධාංගීකරණය කිරීම හේතුවෙන්, ජපාන යෙන්, කොරියානු වොන් සහ යූරෝ අධි ප්‍රමාණය විය. ජපානයේ ජංගම ගිණුමෙහි අඛණ්ඩව අතිරික්තයක් පැවතීම හේතුවෙන් ජපාන යෙන් තියුණු ලෙස අධි ප්‍රමාණය වූ අතර, ජපාන බලධාරීන්ට ඒ අනුව විදේශ විනිමය වෙළෙඳපොළෙහි මැදිහත් වීමට සිදුවිය. චීනය සිය ව්‍යවහාර මුදල ආන්තික වශයෙන් ප්‍රතිප්‍රමාණය කළ අතර, ඉන්පසු තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා රෙන්මින්බි අවප්‍රමාණය වීමට ඉඩ හැරීය. ජපාන මහ බැංකුව (Bank of Japan) මඟින් ප්‍රකාශයට පත්කළ ප්‍රමාණාත්මක මූල්‍ය ලිහිල්කරණය සහ එක්සත් ජනපද මහ බැංකුව (Federal Reserve) විසින් එ.ජ.ඩොලර් බිලියන 600 ක් වටිනා දිගුකාලීන රාජ්‍ය බැඳුම්කර මිලදී ගැනීමට කටයුතු කිරීම මගින් මුදල් වර්ගවල උච්ඡාවචනය සඳහා බලපෑම් ඇති කරන ලදී.

**ඉහළ විදේශීය ආයෝජන මූල්‍ය ප්‍රවාහ හමුවේ නැගී එන සහ දියුණුවෙමින් පවතින රටවල කොටස් සහ ණය වෙළෙඳපොළවල් 2010 වසර තුළ දී වැඩි දියුණු විය.** කෙසේ වෙතත්, ගෝලීය ආර්ථිකයේ යථාතත්ත්වයට පත්වීම හා එහි තිරසාර බව පිළිබඳව පැවති අවිනිශ්චිතතා හේතුවෙන් බොහෝ හිමිකම්

**1.4 සංඛ්‍යා සටහන** **ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | ප්‍රත්‍යක්ෂ අගයන් | | පුරෝකථන | |
|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 |
| **ලෝක නිෂ්පාදිතය** | **2.8** | **-0.6** | **5.0** | **4.4** |
| සංවර්ධිත ආර්ථිකයන් | 0.2 | -3.4 | 3.0 | 2.5 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 0.0 | -2.6 | 2.8 | 3.0 |
| යුරෝ කලාපය | 0.5 | -4.1 | 1.8 | 1.5 |
| එක්සත් රාජධානිය | -0.1 | -4.9 | 1.7 | 2.0 |
| ජපානය | -1.2 | -6.3 | 4.3 | 1.6 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 6.0 | 2.6 | 7.1 | 6.5 |
| සංවර්ධනය වන ආසියාව | 7.7 | 7.0 | 9.3 | 8.4 |
| චීනය | 9.6 | 9.2 | 10.3 | 9.6 |
| ඉන්දියාව | 6.4 | 5.7 | 9.7 | 8.4 |
| **ලෝක වෙළෙඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **2.9** | **-10.7** | **12.0** | **7.1** |
| ආනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 0.4 | -12.4 | 11.1 | 5.5 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 9.0 | -8.0 | 13.8 | 9.3 |
| අපනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 1.9 | -11.9 | 11.4 | 6.2 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 4.6 | -7.5 | 12.8 | 9.2 |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 3.4 | 0.1 | 1.5 | 1.6 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 9.2 | 5.2 | 6.3 | 6.0 |
| වෙළෙඳ ද්‍රව්‍ය මිල (එ.ජ.ඩොලර්) | | | | |
| ඉන්ධන | 36.4 | -36.3 | 27.8 | 13.4 |
| ඉන්ධන නොවන | 7.5 | -18.7 | 23.0 | 11.0 |
| **එ.ජ.ඩොලර් තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය (සියයට)** | **3.0** | **1.1** | **0.6** | **0.7** |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස

මූලය: World Economic Outlook, ජා.මූ.අ. (2011 ජනවාරි සහ 2010 ඔක්තෝබර්)

ප්‍රාග්ධන වෙළෙඳපොළවල අලාභයන් වාර්තා විය. කල් නොපවත්නා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීම හේතුවෙන් 2010 වසරේ ප්‍රථම කාර්තුව තුළ යුරෝපා සංගමයේ සාමාජික රටවල් කිහිපයක ඇති වූ ස්වෛරීත්ව ණය අර්බුද හේතුවෙන් යුරෝපා කලාපයේ ආර්ථික වර්ධන ශක්‍යතාවයට බාධා එල්ල විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආයෝජකයින් යුරෝපීය ආර්ථිකයන් කිහිපයකගෙන් ඈත් වූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ යුරෝපීය මහ බැංකුව විසින් යුරෝපානු ස්වෛරීත්ව ණය වෙළෙඳපොළ ස්ථායී කිරීම සඳහා අඛණ්ඩ උත්සාහයන් ගනු ලැබීය. පෙර නොවූ විරූ අයුරින් ද්‍රවශීලතාව සැපයීම, ණය ලබාදීම් සහ මූල්‍ය අර්බුද ඇති වූ රටවල සැළකිය යුතු රාජ්‍ය මූල්‍ය මැදිහත්වීම් මගින් මූල්‍ය අර්බුදයට සහනයක් සලසමින් යුරෝපීය ආර්ථික කටයුතු කෙරෙහි එයින් පැවති අයහපත් බලපෑම් තවදුරටත් සමනය කළේය. 2010

[3] ආර්ථිකය උත්තේජනය කරමින් සහ අවධමනකාරී තර්ජන අවම කරමින්, මුදල් වෙළෙඳපොලේ ද්‍රවශීලතාව වර්ධනය කිරීම පිණිස මහ බැංකුවක් විසින් වෙළෙඳපොළෙන් වත්කම් මිලදී ගැනීම හරහා සිය ශේෂ පත්‍රයේ ප්‍රමාණය වැඩි කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ගය ප්‍රමාණාත්මක ලිහිල්කරණයට අදාල වේ. මුදල් ප්‍රතිපත්ති උපකරණයක් ලෙස භාවිතා කළ නොහැකි ශූන්‍යයේ හෝ ඊට ආසන්න මට්ටමේ පවතින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන්ගෙන් යුත් එක්සත් රාජධානියේ ෆෙඩරල් සංචිත බැංකුව, එංගලන්ත මහ බැංකුව සහ ජපාන මහ බැංකුව විසින් නොබෝදා ඇතිවූ ගෝලීය මූල්‍ය අර්බුදය තුළ සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් ලෙස භාවිතා කිරීම මගින් මෙම ප්‍රමාණාත්මක ලිහිල්කරණ ප්‍රසිද්ධ විය.

## විශේෂ සටහන 1

## ශ්‍රී ලංකාව, 'දිළිඳුකම අඩු කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා වූ අරමුදල' (PRGT) සඳහා සුදුසුකම්ලාභී රටක සිට මැදි ආදායම්ලාභී ආර්ථික තත්ත්වයට උසස්වීම

2010 ජනවාරි මස ශ්‍රී ලංකාව 'දිළිඳුකම අඩු කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා වූ අරමුදල' (Poverty Reduction and Growth Trust - PRGT) සඳහා සුදුසුකම් ලත් රටවල ලැයිස්තුවේ සිට මැදි ආදායම්ලාභී ආර්ථිකයක තත්ත්වයට (Middle-Income Status) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) විසින් උසස් කරන ලදී. මෙම උසස් කිරීම සිදුකරනු ලැබුවේ, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් PRGT ක්‍රමය යටතේ සහනදායී පදනම මත මූල්‍ය පහසුකම් ලබගන්නා රටවල් සඳහා නව යෝග්‍යතා රාමුවක් අනුමත කිරීමත් සමඟය.[1] යම් රටක්, PRGT පහසුකම් ලත් රටවල් ලැයිස්තුවෙන් උසස් කරනු ලබන්නේ පහත නිර්ණායකයන් සැපිරීමත් සමඟය. (අ) "අන්තර් ජාතික සංවර්ධන සංගමය" (International Development Association-IDA) මගින් නිර්දේශිත අවම මට්ටමට වඩා ඉහළ ඒක පුද්ගල ආදායම් මට්ටමක් යම් සැලකිය යුතු කාලයක් පුරා පවත්වා ගැනීමට හැකි වීම; (ආ) ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළට ස්ථිර හා ඉහළ ප්‍රවේශයක් සහිතව ළඟා වීමට ඇති හැකියාව; සහ (ඇ) ඒක පුද්ගල ආදායම දැඩි ලෙස පහළ යාම, වෙළෙඳපොළට ප්‍රවේශ වීමට ඇති හැකියාව නැති වීම යනාදී දැඩි අවදානම් තත්ත්වයන්ට කෙටිකාලීන වශයෙන් මුහුණ දීමට සිදු නොවීම, ආදිය වේ.[2]

ශ්‍රී ලංකාව මැදි ආදායම්ලාභී ආර්ථික තත්ත්වයට උසස් කිරීමේ දී ජා.මූ.අ. විසින් සලකා බලන ලද විශේෂ සාධකයන් අතර ප්‍රධාන වනුයේ;

(අ) මෑත වසරවලදී වාර්තා කළ ශක්තිමත් ආර්ථික ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2008 වසරේ දී ඒක පුද්ගල ආදායම, IDA මගින් නිර්දේශිත මට්ටමට වඩා ඉහළ මට්ටමක, එනම්, එ.ජ.ඩොලර් 2,014[3] කරා ළඟාවීම සහ එය පසුගිය වසර 5 ක කාලපරිච්ඡේදය තුළ දී ස්ථායීව වැඩිවන ප්‍රවණතාවයක් පෙන්නුම් කිරීම;

(ආ) රජයේ විදේශීය ණය මධ්‍යකාලීනව ක්‍රමිකව අඩුවනු ඇතැයි පුරෝකථනය කර තිබීම සහ එමගින් රාජ්‍ය ණය ස්ථායී මට්ටමක පවත්වාගැනීම සහතික කිරීම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයන් කාලානුරූපීව ක්‍රියාවට නැංවීම; සහ,

(ඇ) මෑත වසරවලදී ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළට ප්‍රවේශ වීම තුළින් ලබාගත් ප්‍රතිලාභ සහ එම නිසා ජා.මූ. අරමුදලේ වෙළෙඳපොළ පිවිසුම් නිර්ණායකයන් කරා එළඹීමට ශ්‍රී ලංකාවට පැවති හැකියාවය. නිදසුනක් ලෙස, 2009 වසරේ දී නිකුත් කළ පස් අවුරුදු ස්වෛරීත්ව බැඳුම්කර සඳහා සැළකිය යුතු අධි දායකත්වයක් ලැබීම දැක්විය හැකිය.[4]

ශ්‍රී ලංකාව මැදි ආදායම්ලාභී ආර්ථික තත්ත්වයට උසස්වීමත් සමඟ, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ තුළ ඉතා ශක්තිමත් ලෙස පෙනී සිටීමට හැකියාව ලද අතර, එම තත්ත්වය තව දුරටත් පවත්වාගෙන යාම තුළින් ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ සඳහා වන විවෘත භාවය පුළුල් වන අතර, එමගින් ඉදිරි වසරවලදී ඉහළ විදේශ ආයෝජන අවස්ථාවන් ආකර්ෂණය කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

[1] කෙසේ වුවද, ආදායම් කාණ්ඩ පිළිබඳ ලෝක බැංකු වර්ගීකරණය පහත පරිදි වේ. පහළ ආදායම්ලාභී (එ.ජ.ඩොලර් 995 ට වඩා අඩු); පහළ - මැදි ආදායම්ලාභී (එ.ජ.ඩොලර් 996 - 3,945); ඉහළ - මැදි ආදායම්ලාභී (එ.ජ.ඩොලර් 3,946 - 12,195); සහ ඉහළ ආදායම්ලාභී (එ.ජ.ඩොලර් 12,196 හෝ ඊට වැඩි).

[2] ජා.මූ. අරමුදලේ Public Information Notice (PIN), No. 10/16 (February 2010) http:www.imf.org/external/np/sec/pn/2010/pn1016.htm.

[3] 2009 වසරේ දී ලංකාවේ ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 2,057 ක් වූ අතර, එය 2010 වසරේ දී එ.ජ.ඩොලර් 2,399 දක්වා ඉහළ ගියේය.

[4] 2010 වසරේ දී ශ්‍රී ලංකාවේ එ.ජ.ඩොලර් බිලියන 1ක වටිනාකමකින් යුත් දස අවුරුදු ස්වෛරීත්ව බැඳුම්කරය ඉතා තරඟකාරී පොළී අනුපාතයක් යටතේ නිකුත් කරන ලදී.

වසරේ අග භාගය වනවිට ගෝලීය මූල්‍ය තත්ත්වයන්ගේ, විශේෂයෙන්ම දියුණු ආර්ථිකවල මූල්‍ය තත්ත්වයන්ගේ වැඩිදියුණුවීමක් පෙන්නුම් කෙරිණි. අවදානම සඳහා වූ ආන්තිකයන් තවදුරටත් තරකරන ලද අතර, දියුණු ආර්ථිකයන්හි බැංකු ණයදීම්වලට අදාළ කොන්දේසි වැඩිදියුණු කරන ලදී.

අවධමනාත්මක තත්ත්වයන් පිළිබඳව පැවති අවධානම යටපත් වුවද, තවදුරටත් ආර්ථිකයන් යථාතත්ත්වයට පත්වෙමින් පවතින හෙයින් සහ සේවා වියුක්ති අනුපාත තවදුරටත් ඉහළ මට්ටමක පවතින හෙයින් දියුණු ආර්ථිකයන්හි මූල්‍ය අධිකාරීන් විසින් ගනු ලබන ප්‍රමාණාත්මක සහන ප්‍රතිපත්තීන්හි කඩිනම් වෙනස්වීමක් අපේක්ෂා කළ නොහැක. දියුණු ආර්ථිකයන්හි ප්‍රමාණාත්මක සහන ප්‍රතිපත්තීන්වල ප්‍රතිඵලයක් ලෙස, නැගී එන ආර්ථිකයන්හි විදේශ ප්‍රාග්ධන ලැබීම් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර, විදේශ විනිමය අනුපාත අධිප්‍රමාණය වී ඇත. විනිමය අනුපාත අධික ලෙස අධිප්‍රමාණය වීම හරහා අපනයන තරඟකාරීත්වයට ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට මහ බැංකු විසින් ගනු ලබන ස්ථායීකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් නැගී එන ආර්ථිකයන්හි අතිරික්ත ද්‍රවශීලතාවය සහ ස්ථායීකරණ පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, මෙම ආර්ථිකයන් ප්‍රාග්ධන ප්‍රවාහ මත බදු පැනවීම සහ ආයෝජන මත උපරිම සීමාවන් හඳුන්වාදීම යනාදිය තුළින් විදේශීය

ප්‍රාග්ධන ලැබීම් මන්දගාමී කිරීමට සහ මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.

**වර්ධනය අඩුවීමට බලපෑ හැකි අවදානම් කිහිපයක් මධ්‍යයේ වුවද ගනු ලැබූ විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් 2011 වසරේ ආර්ථික වර්ධනය දිරිගන්වන සුළු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මේ දක්වා, ආසියානු කලාපයේ ආර්ථිකයන් යථාතත්ත්වයට පත්වීම ශීඝ්‍රයෙන් සිදුවමින් ශක්තිමත්ව පවතී. කෙටි හා මැදිකාලීන වශයෙන් ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමට නැගී එන ආර්ථිකයන්හි වර්ධනය විශාල දායකත්වයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නවතම පුරෝකථනයන්ට අනුව 2011 වසරේ දී ගෝලීය ආර්ථික වර්ධනය සියයට 4.4 ක් පමණ වනු ඇතැයි ද එයට මූලිකව දායකවන නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික වර්ධන වේගය සියයට 6.5 ක් වනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. දියුණු ආර්ථිකයන්හි ආර්ථික වර්ධන වේගය 2011 වසරේ දී සියයට 2.5 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, දැනට පවතින ඉහළ රැකියා වියුක්තිය අනුපාතය, ඉහළ අයවැය හිඟය, මූල්‍ය අසමතුලිතතාවයන්, සමගම උතුරු අප්‍රිකානු සහ මැදපෙරදිග රටවල පවතින භූ-දේශපාලනික අස්ථාවරත්වය සහ ස්වභාවික විපත් හේතුවෙන් ජපානයේ හටගත් මෑතකාලීන ප්‍රවණතා ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම කෙරෙහි අභියෝග යන් වී ඇත. ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම හමුවේ මැදිකාලීනව ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ගල් අඟුරු ඇතුළු බලශක්ති ඉල්ලුම ඉහළ යා හැකි අතර, ප්‍රධාන ඛනිජ තෙල් නිපදවන රටවල්හි පවතින භූ-දේශපාලනික අස්ථායීතාවය මේ සඳහා අයහපත් අයුරින් බලපෑම් එල්ලකළ හැක. කෙසේ වෙතත්, ජපානයේ ෆුකුෂිමා න්‍යෂ්ඨික බලාගාරයේ ක්‍රියාකාරිත්වය බිඳවැටීම හමුවේ න්‍යෂ්ඨික බලශක්තියට විකල්පයන් වන ඛනිජ තෙල් සහ ගල් අඟුරු සඳහා පවතින ඉල්ලුමට කෙටිකාලීනව පීඩනයක් ඇති නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික කටයුතු පුළුල්වීම සමග ඉහළ ඉල්ලුමක් ඇතිවීම, අහිතකර කාලගුණික තත්ත්වයන් මත ඇති වූ සැපයුම් අංශයේ කම්පන සහ භූ-දේශපාලනික අස්ථායීතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් 2010 මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්හි පාරිභෝගික ද්‍රව්‍ය මිල ගණන් සියයට 1.6 කින් ආන්තිකව ඉහළ යනු ඇති බවටත් නැගී එන සහ දියුණු වෙමින් පවතින ආර්ථිකවල එම මිල ගණන් සියයට 6.0 ක මට්ටමේ ස්ථායීව පවතිනු ඇති බවටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පුරෝකථනය කර තිබේ.

## 1.4 මධ්‍යකාලීන සාර්ව ආර්ථික දැක්ම, අභියෝග සහ ප්‍රතිපත්ති

**අභ්‍යන්තර ගැටුම් අවසන්වීමෙන් පසු ඇති වූ සුභවාදී අපේක්ෂා හා ලෝක ආර්ථිකය ක්‍රමයෙන් යථාතත්ත්වයට පත්වීම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ මැදිකාලීන දැක්ම වඩාත් යහපත් වනු ඇත.** 2010 දී ආර්ථිකයේ ඇති වූ සියයට 8.0 ක වර්ධනය අනුව යමින්, මැදිකාලීනව ආර්ථිකය සියයට 8-9 අතර වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ඉහළ ආර්ථික වර්ධන අපේක්ෂාව සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය අනුබලය යටිතල පහසුකම් වර්ධනය තුළින් වැඩි වූ ධාරිතා උපයෝජනය, උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ලැබෙන විශාල දායකත්වය සමඟින් පුළුල් වන කෘෂිකර්මාන්ත අංශය, ඉහළ ඵලදායීතාව, නිෂ්පාදන වෙළෙඳපොළ විවිධාංගීකරණය හා කර්මාන්ත පුළුල් කිරීම, සංචාරක කර්මාන්තය, වරාය, ප්‍රවාහන කටයුතු, බැංකු හා රක්ෂණ ආදිය ඇතුළත් වෙළෙඳාම සහ සේවා අංශයන්හි පුළුල්වීම මගින් සැපයෙනු ඇත. තවද, සාමය උදාවීමත් සමග ඇති වූ නව ආයෝජන අවස්ථා, බදු ව්‍යුහයට අදාළ අත්‍යවශ්‍ය වෙනස්කම් සිදුකිරීම තුළින් රජය දක්වන ලද කැපවීම සහ රාජ්‍ය ව්‍යවසායයන්ගේ ක්‍රියාකාරකම් හි වර්ධනය මගින් මැදිකාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට අවශ්‍ය සහාය සැපයෙන අතර, එමගින් සාර්ව ආර්ථික ස්ථායීතාව ද සහතික කෙරෙනු ඇත. මෙයට අමතරව, ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වාගැනීම සඳහා ආයෝජන ද.දේ.නි.යෙන් සියයට 35 කට ආසන්න මට්ටමක් දක්වා ඉහළ යා යුතු අතර, දේශීය ඉතුරුම් ද.දේ.නි.යෙන් සියයට 25 ක මට්ටම දක්වා වත් ඉහළ ගෙන එමින් අපේක්ෂිත ආයෝජන මට්ටම තහවුරු කිරීමට සහාය විය යුතුය.

**පෞද්ගලික අංශය සඳහා ණය ලබාදීම අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එම ණය ලබාදීම් මෙන්ම, බැංකු ක්‍රමය මගින් රජය හා රාජ්‍ය සංස්ථා වෙත ණය සැපයීම් ද පිළිබඳව සමීප සුපරීක්ෂාවට ලක් කිරීම තුළින් ඉහළ ඉල්ලුම් පීඩනයන් ගොඩනැගීම පාලනය කිරීමට අපේක්ෂා කෙරේ.** සැපයුම් අංශයේ වර්ධනයන් අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, විචක්ෂණශීලි ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගැනීම තුළින් මැදිකාලීනව උද්ධමනය මැදි - තනි ඉලක්කමක මට්ටමේ (Mid Single Digit Level) පවත්වා ගැනීමට අපේක්ෂා කරයි. මේ අතර, මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව තුළ අපේක්ෂිත පරිදිම, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන්වල නිරන්තර අවධානය සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය හා රාජ්‍ය ණය ක්‍රමිකව අඩු කිරීම සඳහා යොමු වී ඇත. සරල බදු

ව්‍යුහයක් හා පුළුල් බදු පදනමක් තුළින් ඇතිකරගත් ඉහළ බදු ආදායමක් හා තාර්කිකරණය කළ රජයේ පුනරාවර්ථන වියදම් සහ විචක්ෂණශීලී රාජ්‍ය ණය කළමනාකරණය තුළින් ඉහළ ආර්ථික වර්ධන වේගයක් ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය ආයෝජන මට්ටමක් පවත්වා ගනිමින් මෙය ඉටුකර ගැනීමට අපේක්ෂා කරයි.

**විදේශ සංචිත ප්‍රමාණය මාස 5 ක ආනයන මූල්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් වන පරිදි පවත්වා ගැනීමට හැකි වෙමින් විදේශ අංශය මැදිකාලීනව ශක්තිමත්ව පැවතෙනැයි අපේක්ෂා කෙරේ.** ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම, දේශීය ව්‍යාපාරයන්හි ඵලදායිතාවය සහ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය ඉහළ යාම යන කරුණු මත, ඉදිරි වසර කිහිපය තුළ දී අපනයන ඉහළ යාමේ ප්‍රවණතාවය පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පවතින ආකර්ෂණීය මිල ගණන් හේතුවෙන් ඇතිවන පෙළඹවීම මත උතුරු හා නැගෙනහිර පළාත්වල මෙන්ම අනෙකුත් ප්‍රදේශවල ඇති මෙතෙක් භාවිතයට නොගත් ඉඩම් වගා කිරීමෙන් කෘෂිකාර්මික අපනයන වර්ධනය වෙතැයි අපේක්ෂා කෙරේ. නව කර්මාන්ත බිහිවීමෙන් හා පවතින කර්මාන්තයන්හි එකතු කළ අගය ඉහළ යාමෙන් කාර්මික අපනයන ශීඝ්‍ර වර්ධනයක් අත්කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිර්මාණාත්මක අංග ඇතුළත් කිරීම, ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ වූ සන්නම් සඳහා නිපදවීම සහ මෙතෙක් භාවිතයට නොගත් වෙළෙඳපොළවල් වෙත අවතීර්ණ වීම යන මාර්ග හරහා ඇඟළුම් කර්මාන්තය ජාත්‍යන්තර සැපයුම් ක්‍රියාදාමයෙහි බොහෝ ඉදිරියට ගොස් ඇත. නව නිෂ්පාදන බිහි කිරීම හා එකතුකළ අගය ඉහළ නැංවීම තුළින් ආහාර හා පාන වර්ග, රබර් නිෂ්පාදන සහ යන්ත්‍ර-සූත්‍ර හා උපකරණ යන කාණ්ඩයෙහි අපනයනය ද සංවර්ධනය කළ හැකිය. සංචාරක කර්මාන්තයේ වර්ධනය, උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි ප්‍රතිසංස්කරණ කටයුතු, රටපුරා ඇති සංවර්ධන ව්‍යාපෘති සහ අපනයන අරමුණු කරගත් කර්මාන්ත හේතුකොටගෙන ආනයන වියදම ද ඉහළ යනු ඇත. ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමත් සමඟ දිගුකාලීන පාරිභෝගික භාණ්ඩ ආනයනය ද ඉහළ යනු ඇත. ගල් අඟුරු බලාගාරය ආරම්භ කිරීමත් සමඟ ඒ සඳහා ඛනිජ තෙල්වලට සාපේක්ෂව මිල අඩු ගල් අඟුරු ආනයනය කිරීමෙන්, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන වියදම යම්තාක් දුරකට අඩුකර ගැනීමට හැකිවනු ඇත. ඛනිජ තෙල් නිපදවන රටවල ඇති වී තිබෙන්නා වූ භූ-දේශපාලන අර්බුද ජාත්‍යන්තර බොර තෙල් මිල ගණන් මෙන්ම ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ආනයන වියදම ද ඉහළ නැංවීමට හේතු විය හැකි අතර, එමගින්, විශේෂයෙන්ම 2011 වසරේ දී, වෙළෙඳ හිඟය වර්ධනය විය හැකිය. ගෙවුම් ශේෂය සම්බන්ධයෙන් ඇතිවිය හැකි ප්‍රධාන වර්ධනාත්මක සාධකය වනුයේ සංචාරක ක්ෂේත්‍රය, වරාය හා ගුවන්තොටුපොළ ආශ්‍රිත සේවා, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා හරහා ලැබෙන ආදායම තුළින්, මැදිකාලීනව සේවා ආදායම ශීඝ්‍ර ලෙස ඉහළ යාමයි. මැද පෙරදිග රටවල ඇති වී තිබෙන්නා වූ දේශපාලනමය අර්බුද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ කෙරෙහි දැඩි බලපෑමක් ඇති නොකරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මෙම ප්‍රේෂණ තවදුරටත් ජංගම ගිණුමේ හිඟය අඩුකර ගැනීම සඳහා විදේශ විනිමය සපයන්නා වූ සැළකිය යුතු ප්‍රභවයක් ලෙස පවතිනු ඇත. සෘජු විදේශ ආයෝජන ලැබීම් ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික අංශය වෙත විශාල මූල්‍ය ලැබීම් හේතුවෙන්, ගෙවුම් ශේෂය මැදිකාලීනව අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**විනිමය පාලන ලිහිල් කිරීම, නිසි පරිදි යොමු කරන ලද රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් හා වැඩිදියුණු වූ සාර්ව ආර්ථික පරිසරය හේතුකොටගෙන 2011 වසර තුළ හා ඉන් ඉදිරියට රාජ්‍ය අංශය මෙන්ම සෘජු විදේශ ආයෝජන ඇතුළත් වූ පෞද්ගලික අංශයට විදේශ මූල්‍ය ප්‍රවාහ ඉහළ ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට හැකි වනු ඇත.** 2009 වසර අවසානයේ එ.ජ.ඩොලර් බිලියන 6.6 ක් වූ ශ්‍රී ලංකාවේ සංවර්ධන හවුල්කරුවන් වෙත රජයේ සමුච්චිත මූල්‍ය වගකීම් 2010 වසර අවසන් වන විට එ.ජ.ඩොලර් බිලියන 7.1 ක් විය. සංවර්ධන ක්‍රියාවලියට හා මිනිසුන්ගේ ඉපැයීම් ප්‍රභවයන් සඳහා පහසුකම් සලසන ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම් සඳහා වන මෙම ව්‍යාපෘතිවල ක්‍රියාවට නැංවීමේ ගිවිසගත් කාලපරාසය අවුරුදු 2-5 අතර වේ. මෙයට අමතරව, උතුරු හා නැගෙනහිර පළාත්වල විශේෂයෙන් සංචාරක කර්මාන්තයට අදාළ හෝටල්, විදුලි සංදේශ, වරාය, දේපළ සංවර්ධන, කෘෂිකර්මික හා නිෂ්පාදන අංශයන් ආශ්‍රිතව අඛණ්ඩව සිදුවන සංවර්ධන කාර්යයන් සඳහා වැඩිදුරටත් සෘජු විදේශ ආයෝජන ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ඉදිරි වසර කිහිපය තුළ ආර්ථිකය මුහුණදෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ 2010 වසරේ දී ළඟාකරගත් සාර්ව ආර්ථික වර්ධනයන් පවත්වා ගැනීමයි.** 2010 වසරේ දී ආර්ථිකය, සියලු අංශවලින් ලද ධනාත්මක දායකත්වය යටතේ යළි ඉහළ වර්ධනයක් අත්කරගත් අතර, උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගන්නා ලදී. විදේශ අංශය විශිෂ්ට කාර්ය සාධනයක් පෙන්නුම් කළ අතර, නිල සංචිත සතුටුදායක මට්ටමක පවත්වාගත හැකි විය. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා උත්සාහයන් ද

**1.5 සංඛ්‍යා සටහන** — **මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව (අ)**

| දර්ශකය | ඒකකය | 2009 (ආ) | 2010 (ඇ) | පුරෝකථන 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | | | | |
| වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 4,825 | 5,602 | 6,440 | 7,405 | 8,513 | 9,790 |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 3.5 | 8.0 | 8.5 | 9.0 | 9.5 | 9.5 |
| ද.දේ.නි. අවධමනකය | සියයට | 5.9 | 7.3 | 6.0 | 5.5 | 5.0 | 5.0 |
| ඒක පුද්ගල ද.දේ.නි | එ.ජ.ඩොලර් | 2,057 | 2,399 | 2,794 | 3,200 | 3,660 | 4,190 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 24.4 | 27.8 | 29.5 | 32.0 | 33.0 | 34.0 |
| දේශීය ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 17.9 | 18.7 | 19.9 | 23.2 | 25.0 | 27.0 |
| ජාතික ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 23.7 | 24.7 | 25.8 | 29.1 | 30.7 | 32.3 |
| **විදේශීය අංශය** | | | | | | | |
| වෙළෙඳ පරතරය | එ.ජ.ඩොලර් මිලියන | -3,122 | -5,205 | -6,762 | -7,399 | -7,993 | -8,531 |
| අපනයන | එ.ජ.ඩොලර් මිලියන | 7,085 | 8,307 | 9,626 | 10,876 | 12,341 | 14,027 |
| ආනයන | එ.ජ.ඩොලර් මිලියන | 10,207 | 13,512 | 16,389 | 18,275 | 20,334 | 22,558 |
| සේවා (ශුද්ධ) | එ.ජ.ඩොලර් මිලියන | 391 | 698 | 1,148 | 1,487 | 1,778 | 2,209 |
| ජංගම ගිණුමේ ශේෂය | එ.ජ.ඩොලර් මිලියන | -214 | -1,418 | -2,140 | -1,953 | -1,738 | -1,500 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -0.5 | -2.9 | -3.7 | -2.9 | -2.2 | -1.7 |
| සමස්ත ශේෂය | එ.ජ.ඩොලර් මිලියන | 2,725 | 921 | 775 | 525 | 825 | 1,325 |
| විදේශීය නිල සංචිත (ඈ) (ඉ) | එ.ජ.ඩොලර් මිලියන | 5,097 | 6,610 | 8,004 | 8,938 | 9,668 | 10,281 |
| ණය සේවා අනුපාතය (ඊ) | සියයට | 18.9 | 14.6 | 13.5 | 16.2 | 12.6 | 14.3 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | | | | |
| සමස්ත ආදායම් සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 15.0 | 14.9 | 15.6 | 16.3 | 16.6 | 16.7 |
| සමස්ත ආදයම් | ද.දේ.නි.යේ % වශයෙන් | 14.5 | 14.6 | 15.2 | 16.0 | 16.5 | 16.5 |
| ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 0.5 | 0.3 | 0.4 | 0.3 | 0.2 | 0.2 |
| වියදම හා ශුද්ධ ණයදීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 24.9 | 22.9 | 22.4 | 21.5 | 21.3 | 21.5 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.7 | -2.1 | -0.8 | 1.0 | 1.7 | 1.6 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -9.9 | -7.9 | -6.8 | -5.2 | -4.8 | -4.8 |
| දේශීය මූල්‍යනය | ද.දේ.නි.යේ % වශයෙන් | 5.1 | 3.6 | 4.6 | 4.2 | 3.9 | 3.9 |
| රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 86.2 | 81.9 | 80.0 | 75.0 | 71.0 | 67.0 |
| **මූල්‍ය අංශය (උ)** | | | | | | | |
| සංචිත මුදල් වර්ධනය | සියයට | 13.1 | 18.8 | 14.5 | 14.5 | 14.5 | 14.5 |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) | සියයට | 18.6 | 15.8 | 14.5 | 14.5 | 14.5 | 14.5 |
| රාජ්‍ය අංශයට ණය දීම්වල වෙනස | රුපියල් බිලියන | 57.4 | -13.1 | 42.0 | 32.4 | 25.0 | 0.0 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වෙනස | රුපියල් බිලියන | -73.4 | 300.0 | 281.3 | 303.1 | 340.1 | 383.7 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වර්ධනය | සියයට | -5.8 | 25.1 | 18.8 | 17.1 | 16.4 | 15.9 |

(අ) 2011 මාර්තු මැද වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් රහිතව
(ඉ) විදේශීය නිල සංචිත ප්‍රමාණය තුළ 2009 වසරේ දී අනුමත කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ ලැබීම් ද ඇතුළත් කර තිබේ.
(ඊ) මුළු ණය සේවා ගෙවීම්, භාණ්ඩ අපනයන සහ සේවාවන්ගේ ඉපැයීම්වල ප්‍රතිශතයක් වශයෙන්
(උ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලයන්: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ථක ප්‍රතිඵල අත්කර දී ඇත. මෙම වර්ධනයන් හේතුවෙන් වෙළෙඳපොළ පොලී අනුපාතික අඩු වූ අතර, පෞද්ගලික අංශය වෙත ලබාදෙන ණය ප්‍රවාහ වැඩි විය. මෙම සාර්ව ආර්ථික ජයග්‍රහණයන් සුළුකොට තැකිය නොහැක්කේ ප්‍රධාන හා ප්‍රාදේශීය ආර්ථිකයන් විවිධ ආර්ථික අසමතුලිතා හමුවේ සටන් වදින තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවට ඉතා ප්‍රශස්ථ ලෙස වසරක කාලයක් තුළ මෙම තත්ත්වය උදාකර ගැනීමට හැකිවීම හේතුවෙනි. අභ්‍යන්තර සහ විදේශ කම්පනයන් සහ ඉල්ලුම් පීඩනයන් ඇතිවීමට පවත්නා අවකාශය හමුවේ මෙම ළඟාකරගත් තත්ත්වයන් පවත්වාගෙනයාම සහ තවදුරටත් වර්ධනය කරගැනීම මැදිකාලීනව ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඇති අභියෝගයකි. සාර්ව ආර්ථික ස්ථායීතාවය තිරසාර ලෙස පවත්වාගෙනයාම සඳහා සුදුසු ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සමග සැපයුම් අංශ අවහිරතා දුරුකරලීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

**ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවත්නා සහ ඉදිරියේ දී අපේක්ෂිත ඉහළ වර්ධන ප්‍රවණතාවය හමුවේ ශ්‍රම වෙළෙඳපොළේ ඇතිවිය හැකි පීඩනය අවධානය යොමුවිය යුතු නව ගැටළුවක් වනු ඇත.** මෙම තත්ත්වය පෙන්නුම් කරන කරුණු ලෙස පළමුව, උතුරු සහ නැගෙනහිර පළාත් හැරුණු කොට ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල සේවා වියුක්ති අනුපාතය 2002 දී පැවැති සියයට 8.8 ක සිට 2010 වන විට සියයට

4.9 ක් දක්වා ක්‍රමිකව පහත බැසීම හා දෙවනුව, සතියකට වැඩකරන පැය ගණන අනුව පැය 40 හෝ ඊට වැඩි පැය ගණනක් සේවයේ නියුතු සංඛ්‍යාව 2002 දී පැවැති සියයට 60.9 ක සිට 2010 තුන්වන කාර්තුව වන විට සියයට 67.6 ක් දක්වා වැඩිවීම සැලකිය හැක. කෙසේවෙතත්, අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ දර්ශකවලට අනුව, වැටුප් කෙරෙහි විශාල බලපෑමක් නොමැතිව ශ්‍රම බලකාය වෙත අවශෝෂණය කරගත හැකි ශ්‍රමිකයින් සැළකිය යුතු ප්‍රමාණයක් පැවතිය හැකි බව පෙන්නුම් කෙරේ. විශේෂයෙන්, ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය, එනම් වැඩකරන වයසේ ජනගහනයේ අනුපාතයක් ලෙස ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය, 2002 දී පැවැති සියයට 50.6 ක සිට 2010 වන විට සියයට 48.1 ක් දක්වා අඩුවීමක් වාර්තා කලද, මෙම ප්‍රවණතාවය වෙළෙඳපොළ තත්ත්වයන් මත සේවයේ යෙදවිය හැකි ශ්‍රමිකයින් ප්‍රමාණය වෙනස් කරනු ඇත. දැනට කර්මාන්ත හා සේවා අංශයේ සේවයේ නියුතු සේවක ප්‍රතිශතය පිළිවෙලින් සියයට 24.2 ක් හා සියයට 43.1 ක් වන අතර, කෘෂිකර්ම අංශයේ සේවයේ නියුතු ප්‍රතිශතය තවමත් සියයට 32.7 ක ඉහළ අගයක් ගනී. වැඩ කරන පැය ගණන වැඩිවීම තුළින් ඌනසේවා වියුක්තියේ අඩුවීමක් පෙන්නුම් කළද, එය විශේෂයෙන් කෘෂිකාර්මික අංශය තුළ තවමත් දක්නට ලැබෙන සැළකිය යුතු අවදානයක් යොමුවිය යුතු කරුණකි. යාන්ත්‍රීකකරණය ඇතුළු කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව වැඩි කිරීමේ දැනට ක්‍රියාත්මක ක්‍රියාමාර්ග තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වූ ශ්‍රම බලකායෙන් විශාල ප්‍රමාණයක් කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයෙන් ඉවත් කරගත හැකි වෙතැයි අපේක්ෂිත අතර, දැනට ක්‍රියාත්මක මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන වැඩ පිළිවෙළ තුළින් විශාල ශ්‍රම සංචලතාවයකට ඉඩ සැලසෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මෙම දශකය මුලදී ශ්‍රී ලංකාවේ පැවති පැරණි ශ්‍රම නියාමන යාවත්කාලීන කළ ද, නීතිමය හා සමාජමය ගැටළු මෙන්ම අවශ්‍ය ශ්‍රම නිපුණතා සහ පවත්නා ශ්‍රම නිපුණතා අතර පවතින පරතරය නිසා ශ්‍රම නම්‍යශීලීභාවය, තවමත් අඩු තත්ත්වයක පවතී. ශ්‍රමය ලබා ගැනීමට ඇති හැකියාව ඉහළ දැමීමට හා ශ්‍රම සංචලතාවය වර්ධනය කිරීමට ඉවහල්වන, ක්‍රියාත්මක කළ හැකිව පවතින ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වන්නේ නම්‍යශීලී සේවා කාලයක් හඳුන්වාදීම, අර්ධකාලීන සේවා සඳහා පෙළඹවීම, සේවයේ නියුතු දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන් සඳහා දිවා සුරැකුම් හා පාසලෙන් පසු සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම, සමාජ ආරක්ෂණ ජාලය සවිමත් කිරීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, විශේෂයෙන්ම නගරාන්තර හා නගරය තුළ ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම මෙන්ම විදේශ රැකියා සඳහා නික්මයාමට ඇති ශක්‍යතාව අවම කිරීම තුළින් දේශීය වශයෙන් සේවා අවස්ථා පුළුල් කිරීම, මෙන්ම පරිගණකගත කිරීම ඇතුළු නව තාක්ෂණික ක්‍රම යොදාගැනීම් තුළින් ශ්‍රම අවශ්‍යතාව අවම කිරීම යනාදියයි. ශ්‍රම සංචලතාවය වර්ධනය කිරීමට ඉවහල් වන තවත් කරුණක් වන්නේ පාසැල් සහ තෘතීය අධ්‍යාපන පාඨමාලා යාවත්කාලීනකර අධ්‍යාපනයේ තත්ත්වය, එහි ගුණාත්මක බව මෙන්ම වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි වර්ධනය කිරීමයි.

**2009 මැද භාගය වන විට ගැටුම්කාරී වාතාවරණය අවසන්වීමත් සමග ඍණ නිමැවුම් පරතරය එනම් ආර්ථිකයේ අතිරික්ත ධාරිතාවය, ක්‍රමයෙන් අඩුවී ආර්ථිකය ක්‍රමයෙන් ඉහළ වර්ධන මාවතක් කරා ගමන් කරන ලදී.** ගැටුම්කාරී කාලපරිච්ඡේදය තුළ පැවැති අයහපත් ආරක්ෂාකාරී වාතාවරණයෙහි ඍජු හා වක්‍ර බලපෑම්හි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ධාරිතාවය සහ නිෂ්පාදන සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට නොගන්නා ලදී. කෙසේ වුවත්, 2009 වසර මැද භාගයේ සිට විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් තුළ ගොඩබිම් හා නාවුක සම්පත්, හමුදා සේවය සඳහා යෙදවිය යුතු පුද්ගලයින් සංඛ්‍යාව අඩුවීම තුළින් ඇති වූ ශ්‍රමය, හා අන්තර් කලාප ශ්‍රමික සංචලතාවය, දැනට පවතින ප්‍රාග්ධනය ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීම, භෞතික යටිතල පහසුකම් විනාශ කිරීම අවමවීම, පෞද්ගලික ආයෝජනයට ඇති සම්පත් ආර්ථිකයේ වෙනත් අංශ විසින් භාවිතා කිරීම අඩුවීම ආදිය හේතුවෙන් වැඩි සම්පත් ප්‍රමාණයක් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වඩා ඵලදායීව භාවිතා වෙමින් පවතී. නිමැවුම් පරතරය පටුවීමත් සමඟ උද්ධමන පීඩනයන් ඇති වීමේ ඉඩකඩ පැවතිය හැකි වුවද, සම්පත් විශාල ලෙස ලබාගත හැකිවීම තුළින් නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට විතැන් කිරීමට හැකිවන අතර එමගින් නිෂ්පාදන විභවතාවය ඉහළ යාම සිදුවනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ වර්ධන ඉතිහාසයේ විශාල ව්‍යුහාත්මක වෙනස්වීමක් වනු ඇත. සාමාන්‍ය මිල මට්ටමෙහි උච්චාවචනයවීම් වැළැක්වීම සඳහා සත්‍ය නිමැවුමෙහි සහ විභව නිමැවුමෙහි ද මැදිකාලීන වශයෙන් එක ලෙස වර්ධනයක් පවත්වා ගෙන යාම ආර්ථිකය විසින් මුහුණපාන තවත් ප්‍රධාන අභියෝගයකි.

**රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය කෙරෙහි රජයේ කැපවීම පිළිබිඹු කරමින් 2009 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 9.9 ක්ව පැවැති සමස්ත අයවැය හිඟය, ආදායම් එක්රැස්කිරීම සහ වියදම් කළමනාකරණය යන අංශයන් දෙකෙහිම වර්ධනයන් සමගින් 2010 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 7.9 ක් දක්වා අඩු කිරීමට හැකි විය.** ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්වලින් සැලකිය යුතු කොටසක්

විශ්‍රාම ගැන්වීම සහ ඉහළ පිරිවැයක් සහිතව වාණිජ බැංකුවලින් ලබාගත් ණය නැවත පියවීම මගින් රජය බැංකු ක්ෂේත්‍රය වෙතින් ලබාගත් ණය අඩු වී ඇති අතර, එමගින් පෞද්ගලික අංශයට ආයෝජනය සඳහා ඇති සම්පත් ප්‍රමාණය ඉහළ යාමක් සිදු වී ඇත. බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ණය ලබාදීම නැවතත් ඉහළයන තත්ත්වයක් යටතේ 2010 වසරේ දී සමස්ත මුදල් ප්‍රසාරණය නිසි අයුරින් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය උපකාරී විය. කෙසේ වුවද, රාජ්‍ය සංස්ථා සඳහා දුන් ණය වර්ධනයවීම අවධානයට ලක්විය යුතු කරුණකි. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කිසිදු වෙනස්වීමකින් තොරව ඉදිරියට පවත්වාගෙනයාම ඉදිරි වසර කිහිපය සඳහා වන අභියෝගය වේ. මේ අනුව බලනකල ගැටුම්කාරී තත්ත්වයක් පැවති අවදියේ දී රජයට ක්ෂණිකව මූල්‍යමය අවශ්‍යතා ඇතිවීම සිදු වුවද දැන් එබඳු ගැටළුවක් නොමැති බැවින් රාජ්‍ය මූල්‍ය බලධාරීන්ට නිසි පරිදි සිය වියදම් සැලසුම් කළ හැකි වේ. එසේම, බදු පදනම ලිහිල් කිරීම හා පුළුල් කිරීම, බදු සහන තාර්කිකරණය සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම මගින් මැදිකාලීන වශයෙන් ආදායම් ඉහළ නැංවිය හැකි වෙනස්කම් හඳුන්වාදීම හරහා බදු පද්ධතියෙහි දිගු කාලයක් තිස්සේ පවතින ගැටළු අවම කරලීමට රජය දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇත. 2011 වසර සඳහා සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යෙන් සියයට 6.8 ක් දක්වා ද මැදි කාලයේ දී සියයට 5 ක් දක්වා ද තවදුරටත් අඩුවනු ඇති බව අපේක්ෂා කරන අතර, අයවැය හිඟයෙහි දළ දේශීය මූල්‍යයනය අපේක්ෂිත අගයෙහිම පවතිනු ඇත. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය, මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉල්ලුම නිසා ඇතිවන පීඩනය සීමා කිරීමට උපකාරී වනු ඇත.

**රාජ්‍ය මූල්‍ය කටයුතු මත මෙන්ම ඉහළ මුදල් ප්‍රසාරණය මත ඇතිවන පීඩනය ලිහිල් කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන්ගේ ක්‍රියාකාරිත්වය තවදුරටත් වර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.** ජාත්‍යන්තර බොර තෙල් මිල විචලනයවීම සහ දේශීය මිල විචලනයන් කෙරෙහි එයින් ඇතිවන ඍජු බලපෑම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය ආයතනිකමය ප්‍රතිසංස්කරණයන්හි විශේෂිත අවධානය යොමු වූ ආයතනයන්ය. බලශක්ති උත්පාදනය සඳහා වැඩි වියදමක් සහිත ඛනිජ තෙල් මත රැඳී සිටීම අඩු කිරීමේ සිය ක්‍රමෝපායයන් වර්ධනය කිරීම ලංකා විදුලිබල මණ්ඩලය සිදු කර ඇති අතර, එම සැලසුම්ගත වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදුකිරීම තුළින් රජය වෙත ඇති පීඩනය අඩුවනු ඇත. ජාත්‍යන්තර බොර තෙල් මිලෙහි නිරන්තරයෙන් සිදුවන උච්චාවචනයන් සහ දේශීය මිල ප්‍රමාදයන් සහිතව සුළු වශයෙන් පමණක් සංශෝධනය කිරීම මගින් ඍජු වශයෙන්ම බලපෑමට ලක් වූ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට, ජාත්‍යන්තර වෙළෙඳපොළ තත්ත්වය පිළිබිඹු කළ හැකි වන අයුරින් දේශීය මිල වඩා නම්‍යශීලී අයුරින් සංශෝධනය කිරීමට හැකිවන ලෙස එහි ආයතනික රාමුව දියුණු කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. යම් මිල ගැලපීමක් නොකිරීම සිදුවිය යුත්තේ කෙටිකාලීන උච්චාවචනයන් සඳහා පමණි. ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ලංකා විදුලිබල මණ්ඩලයට අමතරව අඩු කාර්යක්ෂමතාවයක් සහිත හෝ දැනට මෙහෙයුම් ක්‍රියාවලියෙහි නොයෙදෙන තවත් රාජ්‍ය ආයතන කිහිපයක්ම ඇත. මෙම රාජ්‍ය ආයතන මගින් ජනතාව මත ඇතිවන අමතර පීඩනය ඉවත් කරලීම සඳහා මෙම ආයතන, රජය හෝ පෞද්ගලික අංශයේ සහභාගීත්වය යටතේ ක්‍රියාත්මක කර තවදුරටත් ප්‍රමාද නොවී නැවත මෙහෙයුම් ආරම්භ කිරීම කළයුතු වේ. උපායමාර්ගික ව්‍යවසායයන් කළමනාකරණයෙහි පවතින අනෙක් ප්‍රධාන අභියෝගය වනුයේ විශේෂඥතාවය සහ කළමනාකරණ කුසලතාවයන්ගේ හිඟය වන අතර, අධ්‍යාපන පද්ධතියෙහි ප්‍රතිසංස්කරණ තුළින් මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය මෙමගින් පෙන්නුම් කෙරේ.

**2010 වසරේ අගභාගයේ දී සහ 2011 වසරෙහි මේ දක්වා කාලය තුළ විශේෂයෙන් බොර තෙල් ඇතුළු වෙළෙඳ භාණ්ඩයන්හි ජාත්‍යන්තර මිල ගණන් වෙනස්වීම සාර්ව ආර්ථික ස්ථායිතාවයට අභියෝග යක් විය හැකි බව පෙන්නුම් කරයි.** උතුරු අප්‍රිකානු සහ මැද පෙරදිග තෙල් නිෂ්පාදනය කරන්නා වූ රටවල් කිහිපයක ඇති වූ භූ-දේශපාලන බාධාවන් සහ ජපානය ඇතුළු රටවල් කීපයක නොබෝදා සිදු වූ ස්වභාවික ආපදා බොර තෙල් මිල ගණන් ඉහළ නැංවීමට හේතු වූ අතර, 2010 වසරේ එ.ජ.ඩොලර් 80 ක්ව පැවති බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල 2011 මාර්තු මස වනවිට එ.ජ.ඩොලර් 110 ක් විය. 2011 වසරේ දී ගෝලීය ඉල්ලුම බලාපොරොත්තු වූ පරිදි යථාතත්ත්වයට පත්වීමත් සමග බලශක්ති මිලෙහි යම් ඉහළයාමක් අපේක්ෂා කළ අතර, දැනට පවත්නා ප්‍රවණතාවය පෙන්නුම් කරනු ලබන්නේ ජාත්‍යන්තර නියෝජිතයන් මෙම වසර මුලදී පුරෝකථනය කළ බලශක්ති මිල රඳවා ගැනීමට නොහැකි වන බවයි. මෙම අනපේක්ෂිත මිල ඉහළයාම ඍජුවම පාරිභෝගිකයන් වෙත යොමු කරනු ලැබුවහොත් දේශීය මිල මට්ටම ඉහළ යාම සිදුවනු ඇති අතර, එය රජය හෝ විදුලිබල මණ්ඩලය දරාගතහොත් එයින් ඇතිවන ප්‍රතිවිපාක වඩා අහිතකර සහ කල්පවත්නා ඒවා විය හැකිය. පාරිභෝගිකයාට මෙම පිරිවැය දැරීමට සැලැස්වුවහොත්, එම ආර්ථික තීරණය තුළින් තාත්වික යෙදවුම් මිල

ගණන් පිළිබිඹු කරනු ඇත. ඉහළ ජාත්‍යන්තර බොර තෙල් මිල ගණන් හේතුවෙන් ආර්ථිකයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා විකල්ප බලශක්ති ප්‍රභව භාවිතා කිරීමට පෙළඹවීම සහ බලශක්ති සංරක්ෂණය කිරීමට වර්තමානයේ ගන්නා උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍යවනු ඇත. ඒ සඳහා දෙමුහුන් (hybrid) වාහන භාවිතය, යහපත් මාර්ග නීති සහ තත්ත්වයෙන් ඉහළ මාර්ග පද්ධතියක් පවත්වාගෙනයාම, යහපත් පොදු ප්‍රවාහන සේවයක් සහ නව පොදු ප්‍රවාහන සේවාවන් හඳුන්වාදීම, වැනි ක්‍රම තවදුරටත් කඩිනම් කිරීම වැදගත් වේ.

**රටෙහි සාමකාමී වාතාවරණය සහ ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමත් සමඟ ඉහළ මට්ටමක එකතු කළ අගය, නව නිෂ්පාදන වර්ධනය කිරීම සහ අපනයන වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අපනයනයන්ට නව වර්ධන මාවතකට පිවිසීමේ විභවතාවක් පවතී.** නවීන තාක්ෂණය යෙදීම සහ විදේශ ආයෝජන භාවිතය තුළින්, නිපුණතා සහිත ශ්‍රමිකයන්ගෙන් ශක්තිමත් වූ ඇතැම් කර්මාන්ත මගින් ගෝලීය වෙළෙඳපොළට වැඩි එකතු කළ අගයක් සහිත භාණ්ඩ සැපයීම සඳහා තවදුරටත් වර්ධනය වීමට අති විශාල හැකියාවක් ඇත. මෙරට ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව සහ දියුණු වූ සාර්ව ආර්ථික පරිසරය හේතුවෙන්, විදේශගත ප්‍රජාවගේ සහ විදේශීය ආයෝජකයන්ගේ ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකිවිය. වෙනත් රටවල් විසින් ආනයනය කර සකසා නැවත අපනයනය කරනු ලබන නිපැයුම්වල උසස් තත්ත්වයේ කොටස් සඳහා වෙළෙඳපොළ අත්කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. මෑතක දී පැවති විද්‍යුත් උපකරණ අපනයනයේ ඉහළ යාම මෙම විශේෂිත වෙළෙඳපොළ පිළිබිඹු කරයි. අපනයන විවිධාංගීකරණය කිරීම මගින් බාහිර වශයෙන් ආර්ථිකයට ඇතිවන බාධාවන් සඳහා මුහුණදීමට හැකියාව ඇතිවන අතර, විශේෂයෙන්ම නැගී එන ආසියාව තුළ පවතින භාවිතා නොකළ වෙළෙඳපොළ අවස්ථාවන් ගෝලීය වර්ධන රටාවන්වල මෑතක දී ඇති වූ ප්‍රවණතාවයන් මගින් හඳුනාගත හැකි විය. විදේශීය පාලනය යටතේ ශතවර්ෂ ගණනාවක් පැවතීමෙන් පසුව ශ්‍රී ලංකාවේ අපනයන සහ විදේශීය වෙළෙඳාම බටහිර වෙළෙඳපොළ දෙසට නැඹුරු විය. මේ නිසා, නැගී එන ආසියාවේ වෙළෙඳපොළ වෙත වෙළෙඳාම නැඹුරු කරවීම සඳහා විශේෂ උත්සාහයක් දැරීම අවශ්‍ය වේ. මේ අනුව පවතින ද්වීපාර්ශවීය සහ බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් තවදුරටත් ශක්තිමත් විය යුතු අතර, වෙළෙඳාමට බාධා ඇති කරන්නා වූ ප්‍රතිපත්තිමය සහ ප්‍රතිපත්තිමය නොවන බාධා ඉවත් කිරීම පිළිබඳ නැවත සාකච්ඡා කළ යුතුය. වෙළෙඳ ගිවිසුම්වල ප්‍රතිලාභ උපරිම ලෙස භාවිතා කරමින් වෙළෙඳාම ඉහළ නැංවීම සඳහා මේ පිළිබඳව වෙළෙඳුන් දැනුම්වත් කළ යුතුය. මෙමගින් ජනතාවට විශාල පරාසයක පැතිරුණු භාණ්ඩ හා සේවා අඩු මිල ගණන්වලට පරිභෝජනය කළ හැකි වන අතර, සාමාජික රටවල ජනතාවගේ ජීවන තත්ත්වයද ඉහළ යනු ඇත. පාරිභෝගිකයා වෙත ඍජුවම ප්‍රවේශ විය හැකි වන පරිදි ගෝලීය සැපයුම් දාමය ග්‍රහණය කරගැනීම සඳහා වෙළෙඳපොළ සහ තොරතුරු පිළිබඳ විශේෂ අවධානය යොමුවූ වෙළෙඳ ප්‍රවර්ධන පැවතිය යුතුය.

**දේශීය ඉතුරුම් ඌනතාවය හමුවේ බලාපොරොත්තු වන ආර්ථික වර්ධනය අත්කර ගැනීමට අවශ්‍යවන ආයෝජන ප්‍රමාණය වැඩිකිරීම සඳහා, ණය නොවන විදේශ ආයෝජන ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීම වැදගත් වේ.** ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා සහ විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා, ව්‍යාපාර හිතෛෂී පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. මෑතකදී විනිමය පාලන රෙගුලාසි ලිහිල් කිරීම, ශක්තිමත් සාර්ව ආර්ථික පරිසරය මෙන්ම රටෙහි සාමය නැවත ස්ථාපිතවීම යන කරුණු ආයෝජන දිරිගන්වනු ලබන අතර, විදේශ ආයෝජන දිරිගැන්වීම සඳහා තවදුරටත් පියවර ගැනීම වැදගත් වේ. දැනට ව්‍යාපාර පවත්වාගෙනයාමේ දර්ශකයෙහි (Doing Business Index) ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකාව 102 වන ස්ථානයේ සිටින අතර, 2014 දී එය 30 වන ස්ථානය දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා රජය විසින් දැනටමත් ප්‍රධාන ආයතනවල පවතින දුර්වලතා නිවැරදි කිරීමට සහ නිලධාරිවාදී බාධක හා ව්‍යාපාර පවත්වාගෙනයාමේදී අදාලවන සෑම පියවරකදීම සිදුවන පිරිවැය අඩු කිරීමට හැකිවන ලෙස අවශ්‍ය වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා කණ්ඩායමක් පිහිටුවා ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව, අදාළ ආයතන සහ ලෝක බැංකු කණ්ඩායම සමඟ එක් වී මෙම ක්‍රියාවලිය මෙහෙයවමින් සිටී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයෝජකයන්ට තොරතුරු ලබාදීම සඳහා 2010 ඔක්තෝබර් මාසයේ දී "ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා පියවරෙන් පියවර උපදෙස්" (A step by step Guide to Doing Business in Sri Lanka) ප්‍රකාශයට පත් කරන ලදී. සැලසුම්කර ඇති පරිදි අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ ඉදිරි කාලය තුළ දී ඉලක්කගත ශ්‍රේණි ලබාගැනීම සඳහා ආයෝජන වාතාවරණය වර්ධනය කිරීමත් ආර්ථිකයේ පූර්ණ වර්ධන විභවතාවය අවබෝධ කරගැනීමත් අවශ්‍ය වේ.

**ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම සහ සම්පත් උපයෝගී කරගනිමින් දැනුම් කේන්ද්‍රයක්, වාණිජ්‍ය කේන්ද්‍රයක්, නාවික/සමුද්‍රීය කේන්ද්‍රයක්, ගුවන් ගමන්**

**කේන්ද්‍රයක් සහ බලශක්ති කේන්ද්‍රයක් වශයෙන් වැදගත් කේන්ද්‍රස්ථාන පහක් පිහිටුවමින්, ශ්‍රී ලංකාව උපායමාර්ගිකව වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට රජය සැලසුම් කර ඇත.** දැනුම් කේන්ද්‍රයේ ප්‍රධාන මූලිකාංග ලෙස දැනුම උත්පාදනය, උපයෝගීතා ස්ථාන වෙත දැනුම ලබාදීම සහ අධ්‍යාපනය සහ පුහුණුව ඔස්සේ අන් අයට දැනුම සම්ප්‍රේෂණය කිරීම දැක්විය හැකිය. ශ්‍රී ලංකාව තුළ දැනුම් කේන්ද්‍රයක් බිහිකිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය වෙත මූලික අවධානය යොමු වී ඇත. තවද, දැනටමත් මෙම ක්ෂේත්‍රය ලබා ඇති අති විශාල දියුණුව මෙන්ම ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි ඉහළ පුහුණුවක් සහිත සේවක පිරිසක් සිටීම ශ්‍රී ලංකාව තුළ දැනුම් කේන්ද්‍රයක් ස්ථාපනය කිරීමට මෙය වඩාත් යෝග්‍ය අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. ශ්‍රී ලංකාව වාණිජමය නාවික/සමුද්‍රීය කේන්ද්‍රයක් බවට පත්කිරීම සඳහා කොළඹ වරාය ප්‍රධාන ප්‍රතිනැව්ගත කිරීමේ වරායක් බවට පත් කිරීම, ගාලු වරාය සංචාරක වරායක් ලෙස සංවර්ධනය කිරීම, ත්‍රිකුණාමල වරාය කාර්මික වරායක් ලෙස සංවර්ධනය කිරීම, ඔලුවිල් වරාය ධීවර වරායක් ලෙස සංවර්ධනය කිරීම, හම්බන්තොට වරාය භාණ්ඩ ප්‍රවාහන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ මධ්‍යස්ථානයක් කිරීම සහ නාවික, වෙළෙඳ, මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස රට සංවර්ධනය කිරීම ඇතුළත් වේ. ශ්‍රී ලංකාව ගුවන් කේන්ද්‍රයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කටුනායක ගුවන් තොටුපොළ නවීකරණය කිරීම සහ මත්තල දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදිකිරීම, දේශීය ගුවන් තොටුපොළවල් වැඩිදියුණු කිරීම සහ ගුවන් කර්මාන්ත කටයුතු සංවර්ධනය කිරීම ඇතුළත් වේ. ශ්‍රී ලංකාව බලශක්ති කේන්ද්‍රයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා නව බලශක්ති ප්‍රභවයන් වැඩිදියුණු කිරීම, නව පිරිපහදු මධ්‍යස්ථාන ඉදිකිරීම සහ ඛනිජ තෙල් ජාත්‍යන්තරව වෙළෙඳාම් කිරීමට අවශ්‍ය තාක්ෂණික ඥානය ලබාගැනීම අදාළ වේ. ශ්‍රී ලංකාවේ උපක්‍රමික භූගෝලීය පිහිටීමෙන් උපරිම ඵල නෙලාගැනීමට මෙම පංච-කේන්ද්‍රයන් ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර වැදගත් වන අතරම, මෙම සංකල්පය වඩාත් ඵලදායී ලෙස සහ යුහුසුළුව ස්ථාපිත කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම වැදගත් වේ. මෙම පංච-කේන්ද්‍රයන් පිහිටුවීමට විවිධ ආයතනයන් හි අදාළ පාර්ශවකරුවන් එක් වී ක්‍රියාකළ හැකි මූලික මධ්‍යස්ථානයක් පිහිටුවීම තුළින් සියළු කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය වේ. මෙම පංච-කේන්ද්‍රයන් පිහිටුවීම සඳහා පවතින ප්‍රධාන බාධාවක් වනුයේ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟකමයි. ඒ අනුව, දැනුම් කේන්ද්‍රයක් ඇති කිරීමේ එක් උපක්‍රමයක් වශයෙන් ඉහත දැක්වූ පංච-කේන්ද්‍රයන් බිහිකිරීම සඳහා අවශ්‍ය නිපුණතාවය සහිත පුද්ගලයන්ට අදාළ පුහුණුව ලබාදීම සිදුකළ යුතු වේ. මේ සඳහා, විශ්ව විද්‍යාල සමග ඒකාබද්ධ වීමෙන් අදාළ පංච-කේන්ද්‍රයන් සංවර්ධනයට අවශ්‍ය දැනුම සහ කුසලතාවය ලබාගත හැකි උපාධි පාඨමාලා ආරම්භ කිරීම සිදු කළයුතුය.

**සංචාරක අංශය ආර්ථික කටයුතු වර්ධනයට හේතුවන අංශයක් ලෙස හඳුනාගෙන තිබීම නිසා මෙන්ම එම කර්මාන්තයේ විශාල ආදායම් උත්පාදන හැකියාවන් පවතින බැවින්, වසර 2016 වන විට අපේක්ෂා කරනු ලබන මිලියන 2.5 ක් වන සංචාරක පැමිණීම් ආකර්ෂණය කර ගැනීමට රට තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල සහ වෙනත් පහසුකම් වැඩිදියුණු කළ යුතු වේ.** ප්‍රධාන වශයෙන්ම සංචාරක ආකර්ෂණයක් පවතින ප්‍රදේශ තුළ සංචාරකයන් විසින් වැඩිකාලයක් සහ මුදලක් වැය කරන බව තහවුරු කර ගතයුතු වේ. සංචාරක කර්මාන්තය සඳහා වන ප්‍රධාන සැලැස්මක් අත්‍යවශ්‍ය වන අතර එමගින් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ව්‍යාපෘති කඩිනම් කිරීමත් ඒ සඳහා තිබෙන බාධා ඉවත් කිරීමත් සිදුකළ යුතුය. මේ අනුව රජය සහ පෞද්ගලික අංශය විසින් එක්ව රටේ සංචාරක ආකර්ෂණය සඳහා ඇති විවිධ අවස්ථාවන් ප්‍රවර්ධනය කළ යුතුය. රජය විසින් සංචාරක කටයුතු ආශ්‍රිත යටිතල පහසුකම් සහ ආයතන දියුණු කිරීම, වෙළෙඳපොළ ආකර්ෂණය කර ගැනීම සහ පෞද්ගලික අංශය ආයෝජන සඳහා හිතකර වාතාවරණයක් නිර්මාණය කිරීම පිළිබඳව අවධානය යොමු කළයුතු අතර, පෞද්ගලික අංශයේ නිෂ්පාදන දියුණු කිරීම සඳහා ප්‍රධානත්වය ගෙන ක්‍රියා කළයුතු වේ. සංචාරකයන් සඳහා ලබාදෙන සේවාවේ ගුණාත්මක බව තහවුරු කිරීමට සංචාරක අංශයේ විවිධ පාර්ශ්වකරුවන් අතර, මානව සම්පත දියුණු කිරීම ද අවශ්‍ය වන අතර, ඒ අනුව ධනාත්මක ප්‍රසිද්ධියක් ලබාදී සංචාරකයින් වැඩි වශයෙන් ආකර්ෂණය කරගැනීමට කටයුතු කළ හැකිවේ. විවිධත්වය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට හේතුවන අතර, යම් භාණ්ඩයක් පරිභෝජන මට්ටම දක්වා ගෙනඒමේ ක්‍රියාවලිය අවබෝධ කරගැනීමට සංචාරකයින් දක්වන කැමැත්ත සැලකිල්ලට ගෙන විවිධ සංචාරක කණ්ඩායම්වලට ගැලපෙන විවිධ නිෂ්පාදන විවිධාංගීකරණයකින් යුක්තව නිපදවීම සංචාරක කර්මාන්තය ඉදිරියේදී තවදුරටත් වර්ධනය කිරීමට වැදගත් වේ. සංචාරක කර්මාන්තය හා ආශ්‍රිත සියලුම ව්‍යාපෘති ආදායම් ඉපයීමට, සේවා නියුක්තිය ඇති කිරීමට සහ රටේ ආර්ථික වර්ධන අවස්ථාවන් ඇතිකිරීමට හේතු වුවද, සංචාරක කර්මාන්තය සම්බන්ධ සම්පත් තිරසාර ලෙස සංවර්ධනය වීම සහතික කර ගැනීම සඳහා පාරිසරික සහ සමාජ - සංස්කෘතික සාධකද සැලකිල්ලට ගතයුතු වේ.

**මූල්‍ය අර්බුදයන්ට මුහුණ දුන් රටවල් එසේ අර්බුදයන්ට මුහුණ නොදුන් රටවලට සාපේක්ෂව වැඩි ආර්ථික පසුබෑමකට ලක් වූ බවට මෑත කාලීන ජාත්‍යන්තර සාක්ෂි මගින් නැවත තහවුරු කර ඇති අතර, මෙය අර්බුදයට ලක් වී ඇති මූල්‍ය පද්ධතීන් මූල්‍ය අතරමැදිකරණයේ මෙන්ම මුදල් සම්ප්‍රේෂණ ක්‍රියාවලියේ ද කාර්යක්ෂමතාවය අඩු කිරීමට හේතුවන බව පෙන්නුම් කර ඇත.**[4] ගෝලීය මුදල් සහ මූල්‍ය ප්‍රතිසංස්කරණවලට සහායදීම අර්බුද පැතිරයාම අඩු කිරීමට හේතුවන අතර, දේශීය මූල්‍ය අධීක්ෂණ ක්‍රියාදාමයේ සිදුවෙමින් පවතින වැඩිදියුණු වීම්, නියාමකයින් අතර සම්බන්ධීකරණය බලගැන්වීම, සාර්ව විචක්ෂණ නියාමන ශක්තිමත් කිරීම, විවිධ ප්‍රකාශන සහ වෙනත් සන්නිවේදන මාධ්‍ය මඟින් ජනතාව දැනුම්වත් කිරීම සහ මහ බැංකුව විසින් මෑතදී භාවිතා කරනු ලැබූ මුදල් ප්‍රතිපත්ති විග්‍රහය සඳහා වන ද්විත්ව ප්‍රවේශය තුළ වූ මූල්‍ය අංශ විශ්ලේෂණය, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ නැංවීම සඳහා මූල්‍ය අංශයේ දායකත්වය, ප්‍රධාන වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ණය ලබාදීම, සංවර්ධන ක්‍රියාදාමයේ දී රටේ ආර්ථික වශයෙන් පසුගාමී ක්ෂේත්‍රයන් ඇතුළත් කර ගැනීම පිණිස මූල්‍ය අංශයේ දායකත්වය පුළුල් කරමින් දීර්ඝ කාලීන ණය ලබාදීම් වැඩි කිරීම, නවීන තාක්ෂණය යොදාගැනීම සහ මූල්‍ය අංශයේ නව්‍යකරණය සඳහා සක්‍රීය ලෙස දිරිගැන්වීම් සහ උපකාර ලබාදීම අවශ්‍ය වේ.

**උතුරු සහ නැගෙනහිර පළාත්වල ප්‍රතිසංස්කරණ කටයුතු, භෞතික, සමාජයීය සහ ජීවනෝපායයන් සංවර්ධනය මෙන්ම මූල්‍යමය යටිතල පහසුකම්වල සැලකිය යුතු ප්‍රගතියක් 2010 වසරේ දී සිදු වී ඇති අතර, මෙම ක්‍රියාවලිය තවදුරටත් පවත්වාගෙනයාම අවශ්‍ය වේ.** උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ රටේ අනෙකුත් පළාත් සමග සම්බන්ධවීම මූලික භෞතික යටිතල පහසුකම් වන මහාමාර්ග සහ දුම්රිය මාර්ග පුළුල්වීමත් සමග තවදුරටත් වර්ධනය වනු ඇත. කෘෂිකාර්මික වර්ධනය පිළිබඳව සලකනවිට කෘෂි නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ඉඩම් භාවිත ප්‍රතිපත්ති හඳුන්වාදීම, මෙම ප්‍රදේශවලට නව බෝග වර්ගයන් හඳුන්වාදීමට හැකිවන අයුරින් නව කෘෂිකාර්මික පර්යේෂණ සඳහා අනුග්‍රහය සැපයීම, ගැඹුරු දිය ධීවර කර්මාන්තයට අවශ්‍ය පහසුකම් සැලසීම මෙන්ම ධීවර වරාය පහසුකම් අඛණ්ඩව වර්ධනය කිරීම සහ දකුණු ඉන්දියානු සහ ශ්‍රී ලාංකික ධීවරයන් අතර පවතින ගැටුම් තත්ත්වයන් මිත්‍රශීලී ලෙස නිරාකරණය කරගැනීම වැනි ක්‍රියාමාර්ග මගින් රටේ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ දැමීම සිදුකළ හැකි අතර, එමගින් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි නිෂ්පාදකයින්ට මූල්‍යමය ප්‍රතිලාභ සම්ප්‍රේෂණය වනු ඇත. එසේම, ප්‍රදේශයේ මහා පරිමාණ කර්මාන්ත යළි ආරම්භ කිරීම ඇතුළුව කෘෂි නිෂ්පාදිත සම්බන්ධ කර්මාන්ත සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අනුග්‍රහය දැක්වීම පිණිස පෞද්ගලික අංශය දිරිමත් කිරීම ද නොකඩවා සිදුවිය යුතුය. සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවාවන් වර්ධනය සඳහා පෞද්ගලික අංශයේ වඩා පුළුල් සහභාගිත්වයක් ලබාගැනීම, ඉන්දියානු උප මහාද්වීපය ආශ්‍රිත කලාපයට සැපයුම් කේන්ද්‍රස්ථානයක් වීමේ ඉදිරි අපේක්ෂාවෙන් ත්‍රිකුණාමල වරාය කාර්මික වරායක් වශයෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම සේවා අංශයෙහි වර්ධනය සඳහා අවශ්‍ය වේ. එමෙන්ම, මහා මාර්ග සහ දුම්රිය සේවා ජාලයෙහි ශීඝ්‍ර වර්ධනයට අමතරව, උතුරු හා නැගෙනහිර පළාත් සම්බන්ධවන මුහුදු සහ නැව් මාර්ග, සංචාරක ක්ෂේත්‍රයට සහ පොදු ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමද ඉතා වැදගත් වන අතර, එමඟින් එම ප්‍රදේශ රටෙහි අනෙකුත් පළාත් සමග සම්බන්ධවීම මෙන්ම එමඟින් ලැබෙන ආර්ථික වාසි මුළු ආර්ථිකය පුරා විහිදී යෑම සිදු වනු ඇත.

**ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කිරීම සහ 2016 වසරේ දී ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 4,000 දක්වා දෙගුණ කිරීමට අදාළ රජයේ ඉදිරි දැක්ම සඳහා සියයට 8.0 කට ආසන්න වර්ධන වේගයක් ඉදිරි වසර කිහිපය තුළ පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.** උචිත ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තීන් තුළින්, උද්ධමනය ස්ථායී අඩු මට්ටමක පවත්වාගැනීමට හැකිවූ අතර, අපේක්ෂා කළ පරිදි රටේ ආර්ථික වර්ධන වේගය කඩිනම්වීම තුළින් ශීඝ්‍ර වර්ධන මාවතකට නැවත පිවිසීමට පසුගිය වසර තුළ දී හැකියාව ලැබිණි. ඉදිරි වසරවලදී ඇති අභියෝග අතර, පෞද්ගලික අංශයට ප්‍රමාණවත් අයුරින් අවශ්‍ය ණය ප්‍රවාහ ලබාදීම, ආර්ථික වර්ධන ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා යටිතල පහසුකම් සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතීන් හි අවශ්‍යතාවයන් ඉටු කරන අතර, උද්ධමනය අඩු සහ ස්ථායී මට්ටමක පවත්වාගැනීම මූලික වේ. දැනට පවතින වර්ධන ක්‍රියාවලිය හේතුවෙන් දේශීය සම්පත් සඳහා පවතින අධි ඉල්ලුම තුළින් කෙටිකාලීන මිල පීඩනයන් ඇති විය හැකි නමුත්, අහිතකර දේශීය හා විදේශීය ඉල්ලුම් සහ සැපයුම් කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණුකිරීම තුළින් රට තුළ දීර්ඝකාලීන ස්ථායීතාවයක් ගොඩනැගීමට හැකි වනු ඇත.

[4] "ගෝලීය අර්බුදය තුළ මහ බැංකු ආදර්ශයන්", ස්ටැන්ලි ෆිෂර්, ඉන්දීය මහ බැංකු විවරණිකාව, මාර්තු 2011, පි: 281-290 සහ Carman Reinhart, Kenneth Rogoff 'This Time is Different", ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාල මුද්‍රණ 2009 වර්ෂය.

## විශේෂ සටහන 2

## ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම

රටක ආර්ථික සංවර්ධනයේ දී එහි ආයතනික අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන බව බහුල ලෙස පිළිගනු ලබයි. එමනිසා ශීඝ්‍ර සංවර්ධනයක් බලාපොරොත්තු වන රජයන්, රටෙහි ආයතනික අංශයේ යහපාලනයක් ඇති කිරීමට උපකාරී වන්නා වූ නීතිමය රාමුවක් නිර්මාණය කිරීම සඳහා තම අවධානය යොමු කළ යුතු වේ. එසේම, ආර්ථික කටයුතු සඳහා සුදුසු නීති පද්ධතියක් ද අවශ්‍ය වන අතර, ඒ තුළ දේපළ හිමිකම සහතික කිරීම, ආරවුල් විසඳීමේ පිරිවැය අඩු කිරීම, අන්තර් ආර්ථික ක්‍රියාකාරීත්වයන් පිළිබඳව පුරෝකථනයන්ට එළඹීමේ හැකියාව වැඩි කිරීම සහ අපයෝජනයන්ට එරෙහිව විධිවිධානයන් ගිවිසුම්ගත පාර්ශවයන් හට ලබා දීම වැනි නීතීන් ඇතුළත් කළ යුතු වේ. මෙවැනි යහපත් නීති රීති පැවතීම තුළින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම වැඩිදියුණු වනවා පමණක් නොව, ආර්ථික හා මූල්‍ය අර්බුදයන් හමුවේ එහි ඔරොත්තු දීමේ හැකියාව ද වැඩිදියුණු වේ.

ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳව අධ්‍යයනය කිරීමේ ව්‍යාපෘතිය මීට වසර 9 කට පෙර ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) මගින් අරඹන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ව්‍යාපාරයක නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විෂයානුබද්ධ පදනමක් සැපයීමයි. ''ව්‍යාපාර පවත්වාගෙන යාම - 2011: ව්‍යවසායකයන් සඳහා වෙනසක් නිර්මාණය කිරීම'' එහි වාර්ෂික වාර්තා පෙළෙහි 8 වැන්න වන අතර, එමගින් ව්‍යාපාරික ක්‍රියාකාරකම් වැඩිදියුණු කර ගැනීමට ඉවහල් වන නියාමනයන් සහ එයට ඇති බාධක පිළිබඳව විමර්ශනය කරනු ලබයි. තවද, මෙමගින් ඇෆ්ගනිස්ථානයේ සිට සිම්බාබ්වේ දක්වා

**සංඛ්‍යා සටහන වි.ස. 2.1**

**ව්‍යාපාර පවත්වාගෙන යාමේ දර්ශක 2011**

| | | | |
|---|---|---|---|
| 1 | **ව්‍යාපාරයක් ඇරඹීම**<br>පවත්නා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව, ගතවන කාලය, පිරිවැය හා අලුතින් ව්‍යාපාරයක් ඇරඹීම සඳහා අවශ්‍ය අවම ප්‍රාග්ධනය | 6 | **බදු ගෙවීම**<br>බදු ගෙවීම් සංඛ්‍යාව, බදු වාර්තා පිළියෙල කිරීම, ගොනුගත කර ගැනීම හා බදු ගෙවීමට ගතවන කාලය, ගෙවනු ලබන මුළු බදු ප්‍රමාණය එම බදු ගෙවීමට පෙර වූ ලාභයෙහි අනුපාතයක් ලෙස |
| 2 | **ගොඩනැගිලි බලපත්‍රවලට අදාළ අනුමැතිය ලබාගැනීම**<br>පවත්නා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව, ගොඩනැගිලි බලපත්‍ර ලබා ගැනීම, පරීක්ෂාව හා උපයෝගී සේවා සබඳතා ලබා ගැනීම සඳහා ගතවන කාලය හා පිරිවැය | 7 | **දේශසීමා හරහා වෙළෙඳාම් කිරීම**<br>ආනයන හා අපනයන සඳහා ගතවන කාලය හා පිරිවැය, පවත්නා ලියකියවිලි සංඛ්‍යාව |
| 3 | **දේපළ ලියාපදිංචිය**<br>පවත්නා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව, වාණිජමය නිශ්චල දේපළ පැවරීමට ගතවන කාලය සහ පිරිවැය | 8 | **ගිවිසුම් බලාත්මක කිරීම**<br>පවත්නා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව, ව්‍යාපාරික ආරවුල් විසඳීමට ගතවන කාලය හා පිරිවැය |
| 4 | **ණය ලබා ගැනීම**<br>නෛතික හිමිකම් දර්ශකයේ ප්‍රබලතාව, ණය තොරතුරු දර්ශකයේ ගැඹුර | 9 | **ව්‍යාපාරයක් වසා දැමීම**<br>බුන්වත්භාවය තුළ නැවත යථා තත්ත්වයට පත්වීමේ හැකියාව |
| 5 | **ආයෝජකයන් ආරක්ෂා කිරීම**<br>ආයෝජක ආරක්ෂණ දර්ශකයේ ප්‍රබලතාව, අනාවරණය කිරීමේ දර්ශකයේ ප්‍රමාණය, අධ්‍යක්ෂක වගකීම් දර්ශකයේ ප්‍රමාණය සහ කොටස් කරුවන්ගේ පහසුව දක්වන දර්ශකය | | |

වූ ආර්ථිකයන් 183 ක ව්‍යාපාර නියාමනයන් හා දේපළ හිමිකාරිත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණාත්මක දර්ශක කාලානුරූපීව සංසන්දනය කරනු ලබයි. මෙහිදී ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ගොඩනැගිලි බලපත්‍රවලට අදාළ අනුමැතිය ලබා ගැනීම, දේපළ ලියාපදිංචි කිරීම, ණය ලබා ගැනීම, ආයෝජකයන් ආරක්ෂා කිරීම, බදු ගෙවීම, දේශසීමා හරහා වෙළෙඳාම, ගිවිසුම් බලාත්මක කිරීම හා ව්‍යාපාරය අවසන් කිරීම වශයෙන් වන ව්‍යාපාරයක ජීවන චක්‍රයෙහි අදියර 9 ක දී බලපවත්නා වූ නියාමන කාණ්ඩයන් මිනුම් කර ඇත. ව්‍යාපාර පවත්වාගෙන යාම - 2011 හි, 2010 ජුනි 01 දින තෙක් වන දත්ත විද්‍යාමාන වේ. සෑම මාතෘකාවක් සඳහාම සමාන බරතැබීමක් සිදු කර ඇති අතර, එසේ සමාන බර ප්‍රමාණ තබන ලද මාතෘකා 9 ට දෙනු ලබන ප්‍රතිශත ශ්‍රේණිගත කිරීම්වල සාමාන්‍යය මගින් සමස්ත ශ්‍රේණිගත කිරීමේ දර්ශකය ගණනය කර ඇත. ව්‍යාපාරයේ සෑම අදියරක් සඳහාම දෙයාකාරයක දත්ත සලකා බලා ඇත. පළමු ආකාරය නීති හා රෙගුලාසි මත පදනම් වන අතර, දෙවන ආකාරය කාලය හා චාලක දර්ශක මත පදනම් වේ. සෑම අදියරක් සඳහාම සලකා බලන ලද දර්ශක සංඛ්‍යා සටහන වි.ස. 2.1 හි සාරාංශගත කෙරේ.

ලෝක බැංකුවේ "ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ කණ්ඩායම" හා අධ්‍යයන උපදේශකවරු එක්ව සකස් කළ ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ ශ්‍රේණිගත කිරීම සඳහා අවශ්‍ය දත්තයන් එක්රැස් කර ගනු ලැබේ. මෙම ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර දක්වන්නන් අතර අදාළ රටවල්වල නීතිඥවරුන්, ව්‍යාපාරික උපදේශකවරුන්, ගණකාධිකාරීවරුන් හා රාජ්‍ය නිලධාරීන් වැනි ප්‍රවීණයන් වේ. මෙම ශ්‍රේණිගත කිරීම අවසාන කිරීමට පෙර එහි සම්පාදකයින් විසින් නොයෙකුත් ක්‍රමෝපායයන් භාවිතා කරමින් ප්‍රතිචාර සහ ලබා දුන් දත්ත ඉතා තියුණු ලෙස පරීක්ෂාවට ලක් කෙරේ. මෙම ශ්‍රේණිගත කිරීමේ දී කිසියම් රටක ස්ථානය, එම රට විසින් හඳුන්වා දෙනු ලබන ප්‍රතිසංස්කරණ මෙන්ම අනෙකුත් රටවල්වල සිදු කරන ප්‍රතිසංස්කරණ, ශ්‍රේණිගත කිරීම සඳහා අලුතින් රටවල් හඳුන්වා දීම සහ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයේ සිදුවන වැඩිදියුණු කිරීම් අනුව වෙනස් විය හැකිය. 2011 සඳහා වන ශ්‍රේණිගත කිරීම්වලට අනුව අංක 1 ස්ථානය සිංගප්පූරුවට හිමිව ඇති අතර, රටවල් 183 ක් අතරින් ශ්‍රී ලංකාවට හිමිව ඇත්තේ 102 වන ස්ථානයයි. එමෙන්ම මෙහි 183 වන ස්ථානය හිමිව ඇත්තේ චැඩ් රාජ්‍යයටයි.

**ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීමෙහි පවතින සීමාවන්**

මෙම ශ්‍රේණිගත කිරීමේ නොයෙකුත් දුර්වලතා පවතී. මෙහිදී සැලකිල්ලට ගත යුතු ඉතා වැදගත් කරුණක් වන්නේ, මෙම ශ්‍රේණිගත කිරීමේ දී ග්‍රහණය කරගනු ලබන්නේ ආයතනවලට හෝ ආයෝජකයන්ට හෝ තරගකාරීත්වයට බලපාන්නා වූ සාධක විශාල සංඛ්‍යාවක් අතරින් කිහිපයක් පමණක් බවයි. එනමුදු සාර්ව ආර්ථික ස්ථායිතාව, ආරක්ෂාව, ආයතනයේ ශක්තිමත්භාවය, යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය, දේශීය වෙළෙඳපොළ ප්‍රමාණය, පවතින දූෂණ තත්ත්වයන් හා ශ්‍රමබලකා නිපුණතාවය වැනි සාධක එහිදී සැලකිල්ලට ගනු නොලබයි. විශේෂයෙන්ම, මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය පිළිබඳව සැලකිල්ලට නොගැනීම බරපතල අඩුපාඩුවක් ලෙස සැලකිය හැකිය. මූල්‍ය අංශයේ බිඳවැටීම, මෑත කාලීන මූල්‍ය අර්බුදයට හේතු වූ ප්‍රධාන කරුණක් විය. මෙම ශ්‍රේණිගත කිරීම මගින් නියාමන පරිසරය පිළිබඳව මිනුම් කළ ද ආර්ථිකයේ සියලුම නියාමන අභිමතාර්ථයන් පිළිබඳව මිනුම් නොකෙරේ. එසේම, ව්‍යාපාරයක සලකා බලනු ලබන පියවරයන්වල දී පවා සියලුම නියාමනයන් ආවරණය නොකෙරේ. මෙහි ඇති තවත් දුර්වලතාවයක් නම් එය අදාළ වනුයේ රටෙහි විශාලතම වාණිජ නගරයෙහි පවතින සංස්ථාපිත ආයතන සහ විශේෂ ආකාරයේ ව්‍යාපාර (දේශීය සුළු හා මධ්‍ය පරිමාණ සීමිත සමාගම්) සඳහා පමණක් වීමයි. මේනිසා අනෙකුත් ආකාරයේ ව්‍යාපාරවල (තනි අයිතිය, හවුල් ව්‍යාපාර ආදිය) පවත්නා තත්ත්වයන් මෙමගින් පිළිබිඹු නොවේ. තවද, ශ්‍රේණිගත කිරීමේ දී යම්තාක් දුරකට අත්දැකීම් මත පදනම් වූ විද්වත් ආකල්පයන් ද සම්බන්ධ කරගෙන ඇත. එසේම අවශ්‍ය සියලුම තොරතුරු ව්‍යවසායකයන් ළඟ පවතින බවත්, ඒවා සොයමින් කාලය ගත කිරීමට අවශ්‍ය නොවන බවත්, මෙම ශ්‍රේණිගත කිරීම ගණනය කිරීමේ දී උපකල්පනයක් ලෙස පාදක කරගෙන ඇත. නමුත් සත්‍ය තත්ත්වය මෙය නොවන අතර, තොරතුරු සෙවීම සඳහා සැලකිය යුතු උත්සාහයක් දැරිය යුතු වේ.

**ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම තුළින් හිමිවන වාසි**

ඉහත කී අඩුපාඩුකම් පැවතිය ද, ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම සම්මත මිණුමක් ලෙසින් ඉතා ප්‍රයෝජනවත් වේ. ශ්‍රේණිගත කිරීම මගින් තෝරාගත් ක්ෂේත්‍රවල නියාමන පරිසරය තක්සේරු කෙරේ. එහිදී යහපත් නියාමන පරිසරය ආර්ථිකයක විධිමත් අංශයේ වර්ධනයට උපකාරී වන අතර, අයහපත් නියාමන පරිසරය ව්‍යාපාරවලට අවිධිමත් අංශය තුළ තවදුරටත් රැඳී සිටීමට බලපෑම් කෙරේ. තවද, විධිමත් අංශයේ සමාගම් වේගයෙන් දියුණු වීමට නැඹුරු වීම, බොහෝ ඵලදායී වීම, වැඩි වශයෙන් රැකියා අවස්ථා ජනනය වීම සහ වඩා හොඳ ණය ගැනීම් සඳහා ප්‍රවේශ වීම තුළින් ආර්ථිකයට විශාල වාසි ගෙන දෙයි. රටක ගිවිසුම් බලගැන්වීමේ වාතාවරණයෙහි ගුණාත්මක භාවය මත වෙළඳ ක්ෂේත්‍රය තුළ දී සංසන්දනාත්මකව වාසිදායක තත්ත්වයන් උද්ගත වන අතර, ණය ක්ෂේත්‍රය තුළ දී, විශාල ලෙස ණය කාර්යාංශ මගින් තොරතුරු බෙදාහැරීම තුළින් බැංකුවල ඉහළ ලාභ ඉපයීමක් හා පහළ අවධානමක් ඇති වේ. විදේශ ආයෝජකයන්ට ආවේණික නියාමනයන් පිළිබඳව ව්‍යාපාර පවත්වාගෙන යාමේ ශ්‍රේණිගත කිරීම අවධානය යොමු නොකළ ද මෙම ශ්‍රේණිගත කිරීම, විදේශ ආයෝජකයින් යම් රටක ආයෝජනය කිරීමට පෙර සලකා බලනු ලබන දර්ශක වලින් එකකි. එබැවින් රටක් මෙම ශ්‍රේණිගත කිරීම් තුළ තම ශ්‍රේණිය ඉහළ නංවා ගැනීම,

වඩා වැඩි විදේශ ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට ආධාර වනු ඇත.

**ව්‍යාපාර පවත්වා ගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය**

2011 වසරෙහි ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාව රටවල් 183 ක් අතරින් 102 වන ස්ථානයට පත්වී ඇත. ව්‍යාපාරයක අදියර 9 යේ දී ශ්‍රී ලංකාව හිමි කරගත් ස්ථානයන් 2011 වාර්තාවට අනුව පහත සංඛ්‍යා සටහන වි.ස. 2.2 හි දැක්වේ.

ඉහත සංඛ්‍යා සටහන තුළින්, ව්‍යාපාරයක විවිධ අදියරයන්වලදී ශ්‍රී ලංකාවේ කාර්යසාධනය සැලකිය

**සංඛ්‍යා සටහන වි.ස. 2.2**
**2011 වසරේ දී ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම් අතර ශ්‍රී ලංකාවට හිමි ස්ථාන, ශ්‍රේණිගත කිරීම්වල ඉහළම හා පහළම සිටින ආර්ථිකයන් සාපේක්ෂව සැසඳීම**

| ශ්‍රේණිය | ව්‍යාපාර පවත්වාගෙන යාම 2011 | | |
|---|---|---|---|
| | සිංගප්පූරුව | ශ්‍රී ලංකාව | වැඩි |
| ව්‍යාපාර පැවැත්වීමේ පහසුව | 1 | 102 | 183 |
| ව්‍යාපාරයක් ආරම්භ කිරීම | 4 | 34 | 182 |
| ගොඩනැගිලි බලපත්‍රවලට අදාළ අනුමැතිය ලබාගැනීම | 2 | 169 | 101 |
| දේපළ ලියාපදිංචිය | 15 | 155 | 137 |
| ණය ලබා ගැනීම | 6 | 72 | 152 |
| ආයෝජකයන් ආරක්ෂා කිරීම | 2 | 74 | 154 |
| බදු ගෙවීම | 4 | 166 | 179 |
| දේශ සීමා හරහා වෙළෙඳාම් කිරීම | 1 | 72 | 171 |
| ගිවිසුම් බලගැන්වීම | 13 | 137 | 164 |
| ව්‍යාපාරයක් වසා දැමීම | 2 | 43 | 183 |

මූලය: www.doingbusiness.org


යුතු ලෙස වෙනස් වන බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාව, ගොඩනැගිලි බලපත්‍රවලට අදාළ අනුමැතිය ලබාගැනීම, දේපළ ලියාපදිංචිය, බදු ගෙවීම හා ගිවිසුම්වලට එළඹීම යන අංශවලින් සලකන ලද රටවල් 183 අතරින් 100 වන ස්ථානයටත් වඩා පහළට වැටී ඇති අතර, සමස්ත ශ්‍රේණිගත කිරීම්වලදී පහළ ස්ථානයක් හිමිවීමට මෙය හේතු වී ඇත. ඇත්ත වශයෙන්ම ගොඩනැගිලි බලපත්‍රවලට අදාළ අනුමැතිය ලබා ගැනීම සහ දේපළ ලියාපදිංචි කිරීම යන අංශවලදී, ශ්‍රී ලංකාව, ශ්‍රේණිගත කිරීම්වල පහළින්ම සිටින වැඩි රාජ්‍යයටත් වඩා පහළ මට්ටමක පසුවේ. එමනිසා මෙම අංශ දියුණු කළ හැකි කිසියම් වූ උපායමාර්ගික ප්‍රතිසංස්කරණ යෙදිය යුතු බව පැහැදිලි වේ.

මෙහි දක්වා ඇති රූප සටහන වි.ස. 2.1 මගින් ශ්‍රී ලංකාව, තෝරා ගත් ආසියාතික රටවල් කිහිපයක් සමග සංසන්දනාත්මකව දක්වා ඇත. මෙහි දක්වා ඇති රටවල් 19 සමග සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ කාර්යසාධනය 10 ටත් වඩා පහළ මට්ටමක පවතී. මෙලෙස ඉදිරියෙන් ඇති රටවල් අතර සිංගප්පූරුව, හොංකොං, දකුණු කොරියාව, තායිලන්තය, මැලේසියාව, මොංගෝලියාව, වියට්නාමය, චීනය මෙන්ම දකුණු ආසියාතික රටවල් වන මාලදිවයින හා පාකිස්ථානය ද වේ. මෙම කණ්ඩායමට ශ්‍රී ලංකාවේ වෙළෙඳ තරගකරුවන් කිහිප දෙනෙක් ද ඇතුලත්ව ඇති අතර, ඔවුන්ටත් වඩා දුර්වල තත්ත්වයක ශ්‍රී ලංකාව පැවතීම සැලකිය යුතු කරුණක් වේ.

**ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය වැඩිදියුණු කිරීම**

2014 වන විට ශ්‍රී ලංකාව ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම්වල, තම ස්ථානය 30 දක්වා ඉහළ නංවා ගැනීමට ඉලක්ක කරගෙන ඇති බව අතිගරු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ සමුළුව අමතා කළ කථාවේ දී ප්‍රකාශ කළේය. මෙය විශාල අභියෝගයක් වන අතර ඒ සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ උත්සාහය හා කැපවීම අවශ්‍ය වේ. බොහෝ රටවල් ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම භාවිතා කරමින්, සාර්ථක රටවල්වල පවතින සමාන ආවේණික ලක්ෂණයන් හඳුනාගෙන, එම රටවල්වලට අනුරූපීව තම රටෙහි නීති හා රෙගුලාසි හැඩගස්වා ගනී. ශ්‍රී ලංකා මහ බැංකුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමග එක්ව අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශිත අභිමතාර්ථය මුදුන්පමුණුවා ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රමෝපායයන් සහසම්බන්ධීකරණය කරමින් සිටී. 2011 අයවැය මගින් දැනටමත් බදු අයකර ගැනීම ලිහිල් කිරීමට සුවිශේෂී ඉදිරි පියවරයන් තබා ඇති අතර, එමගින් "බදු ගෙවීම" අංශය තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට අපේක්ෂිතය. තවද, "එක් නැවතුම් කාර්යාල" (one stop shop) ක්‍රමය තුළින් විවිධ අංශයන් හා සම්බන්ධ ක්‍රියාමාර්ග විශාල සංඛ්‍යාවක් ඉවත්කර ගැනීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් පවතී. එමගින් ව්‍යවසායකයින්ට අවශ්‍ය ලියකියවිලි එක් ස්ථානයකට පමණක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර, අදාළ නියෝජිත ආයතන මගින් අනෙකුත් සියලුම අවශ්‍ය නියාමනයන් සහ නිශ්කාශනයන්

**රූප සටහන වි.ස. 2.1**
**තෝරාගත් ආසියාතික ආර්ථිකයන් සමග ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම සැසඳීම**



සිදු කිරීම බාර ගනු ලැබේ. මෙම ක්‍රමය තුළින් ගොඩනැගිලි බලපත්‍රවලට අදාළ අනුමැතිය ලබා ගැනීම සහ දේශ සීමා හරහා වෙළෙඳාම යන අංශ දෙක වඩාත් ඵලදායීව කළ හැකි වනු ඇත. හිමිකම් අයිතිය ලියාපදිංචි කිරීම හඳුන්වා දීම තුළින් ඉඩම් ලියාපදිංචි කිරීමේ ක්ෂේත්‍රය සඳහා ගතවන කාලය ද සැලකිය යුතු ලෙස අඩු වනු ඇත. අධිකරණ ක්‍රියාවලිය ද හොඳින් අධ්‍යයනය කිරීමෙන් ප්‍රමාදයන් අඩු කරගෙන “ගිවිසුම් බලගැන්වීම” යන අංශය තුළ දියුණුවක් ඇති කර ගැනීමට ක්‍රමවේදයන් සෙවිය හැක.

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර සඳහා පහසුකම් සැපයීමට අවශ්‍ය අනෙකුත් අංශ දෙස ද විමසිලිමත්ව සිටී. විශේෂයෙන් ම ව්‍යාපාර පිළිබඳ තොරතුරු සෙවීමට යන කාලය හා ප්‍රයත්නය අවම කිරීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී, ආරම්භයේ සිට සෑම අවස්ථාවක් සඳහාම ව්‍යවසායකයන් හට අත්‍යවශ්‍ය වන තොරතුරු රාශියක් අන්තර්ගත වන (A Step by Step Guide to Doing Business) අත්පොතක් ද ශ්‍රී ලංකා මහ බැංකුව මගින් එළිදක්වා ඇත.